International Journal of Social Statistics - USJ
Volume 01 | Issue 01 | April, 2024

# ශ්‍රී ලාංකේය කුල ක්‍රමයේ පරිහානිය සහ පන්ති ක්‍රමයේ නැගීම

ආර්.කේ.එම්.ටී. ඉන්ද්‍රානි
ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
indrani619v@gmail.com

## Abstract

Number of research studies have been carried out by social scientists, historians and some other professionals on traditional caste system in Sri Lanka, due to the dearth of studies, how caste system was transformed into the class system in the British period. This article is present a concise note on traditional caste system in Sri Lanka and more emphasis will be given to analyze the caste in the British period. Some scholars shrewdly attempted to relate European feudalism to Sri Lankan Caste System. The nature and function of feudalism very signficantly over time and across different nations. According this research, the findings were obtained using the qualitative research method, which is a sociological research theory. Data was collected through primary and secondary sources from Libraries National Archives and through interviews. It is an obvious fact, that there were broad changes occurred due to the transition from traditional agricultural economy to commercial plantation economy. Sri Lanka became a modernized country because of a reaching policy implement and by the British rulers. As a result new social groups emerged. Within this social context, opportunities were avilable for any individual to attain wealth, power, education and social status in this environment. The importance of caste gradually reduced and transformed into class system.

***Keywords:*** *British rulers, Caste, Class, economy*

## 1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පැරණි කුල ක්‍රමය පුද්ගලයාගේ වෘත්තීය දක්ෂතාවය මත පදනම් වී තිබුණි. බ්‍රිතාන්‍යයන්ගේ ආගමනය වන විට උඩරට සිටි රදලයෝ සමාජයේ ඉහළම ස්ථරයේ සිටි අතර පහතරට පාරම්පරික ප්‍රභූන් ඉස්මතු වී සිටි බව පැහැදිලිය. තත් කාලීන යුගයේ ආර්ථික ක්‍රියාවලිය තුළ ශ්‍රම වෙළෙඳපොළක් නිර්මාණය වූ බැවින් ධනවත්භාවය කරා ළඟාවීමට ලාංකික පවුල් කිහිපයකට හැකියාව ලැබුණි. මොවුන් ධනපති පන්තියක් ලෙස විශාල ධනයක් රැස් කළහ. මොවුනගේ අනාගත පරම්පරාවල දරුවන් ඉංග්‍රීසි අධ්‍යාපනය ඔස්සේ නවමු මාවතකට යොමු කළ බැවින් තවත් වෙනම ම වූ පන්ති ගොඩනැගුණි. මෙසේ කුල අභිබවා පන්ති නිර්මාණය වීම බ්‍රිතාන්‍ය යුගයේ දී හඳුනාගත හැකිය. දිගු ඉතිහාසයකට හිමිකම් කියන සමාජ ස්ථරායන (Social Stratification) ක්‍රමයක් වශයෙන් කුල ක්‍රමය හැඳින්විය හැකිය.

### *අධ්‍යයනයේ පසුබිම*

ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය සම්බන්ධව කරන ලද පර්යේෂණ රාශියක් හමුවේ (මයිකල් රොබට්ස්,1982 ; ද සිල්වා. එම්.යූ,1998 ; සිල්වා, කේ.ටී,2005 ; රයන්, බ්‍රයිස්, 2015). එහෙත් සෘජුවම කුලය සමඟ බ්‍රිතාන්‍ය යුගයේ පන්තිය බිහි වූ ආකාරය සමඟ බද්ධ කරමින් කර ඇති පර්යේෂණයන් අල්පය. මෙම පර්යේෂණයේ දී ලංකාවට අනන්‍ය වූ කුල ක්‍රමයක් බිහි වී තිබූ බවත් අධිරාජ්‍යවාදීන් ලංකාවේ කුල ක්‍රමය ඔවුන්ගේ ආර්ථික අවශ්‍යතාවන්ට අනුව

ප්‍රයෝජනයට ගත් බවත් සහ ඉන්දියානු කුල ක්‍රමයට වඩා වෙනස් බවත් පෙන්වා දී තිබේ (රයන්, 2015 : xi). උඩරට පැවති කුල ක්‍රමය වෙනස් ම වූ ආකාරයක් ගත් බව ද පෙනේ. පොදුවේ වැඩවසම් ක්‍රමය වනාහි රටින් රටට, කාලයෙන් කාලයට ඔබින අයුරින් සැකසුන වෙනස් ම වූ සංස්ථාවකි.

පැරණි කෘෂි අර්ථක්‍රමය වාණිජ වතු වැවිලි ආර්ථිකයක් බවට පරිවර්තනය වූ බැවින් ශ්‍රී ලාංකේය සමාජය තුළ පුළුල් විපර්යාසයන් සිදු විය. ලංකාවේ පැවති පැරණි කුල ක්‍රමය බ්‍රිතාන්‍යයෝ ප්‍රයෝජනයට ගනිමින් නිර්මාණය කළ ආර්ථික පරිසරය තුළ නව සමාජ කොටස් බිහි විය. මෙම සමාජ සන්දර්භය තුළ ධනය, බලය, අධ්‍යාපනය සහ සමාජ තත්ත්වය ළඟාකර ගැනීමට ඕනෑම පුද්ගලයෙකුට ඉඩප්‍රස්තා ලැබුණි. එබැවින් ශ්‍රී ලාංකේය සමාජය තුළ කුලයට තිබූ ස්ථානය පසෙකට තල්ලුවෙමින් පන්තිය ඉස්මතු විය.

*පර්යේෂණ ගැටලුව*

ලාංකේය සමාජය තුළ පැවති කුල ක්‍රමය බ්‍රිතාන්‍ය යුගයේ දී හීනවී පන්තිමය ස්වරූපයෙන් නිර්මාණය වන්නේ කෙසේද යන්න විග්‍රහ කිරීමයි. බ්‍රිතාන්‍යයන් විසින් හඳුන්වා දෙන ලද වාණිජ වතුවැවිලි ආර්ථිකය හා වෙනත් වෙළඳ ව්‍යාපාර ඔස්සේ ලාංකිකයන්ට ධන සම්භාරයක් රැස්කර ගැනීමට හැකි වූ බව පෙනේ. එහිදී සමාජයේ ඕනෑම කෙනෙකුට ධනය රැස්කර ගැනීමට (ඉඩම් ද ඇතුළුව) අවස්ථාව ලැබිණ. එම නිසා තරාතිරම නොතකා ඕනෑම පුද්ගලයෙකුට සමාජයේ ඉහළ ස්ථර කරා යාමට පුළුවන් විය. මෙහිදී එවකට පැවති කුල ක්‍රමය අභිබවා පන්ති ක්‍රමයක් නිර්මාණය වූයේ කෙසේ ද යන්න විග්‍රහ කිරීම සිදු කෙරේ.

*අරමුණු*

සාම්ප්‍රදායිකව පැවති කුල ක්‍රමය අධ්‍යයනය කරමින් බ්‍රිතාන්‍යයන්ගේ ප්‍රතිපත්තීන් හමුවේ එවකට සිටි දේශීය ජනයාගේ ක්‍රියාකාරීත්වය හඳුනා ගැනීම එක් අරමුණකි. එම ක්‍රියාකාරීත්වය තුළ පැවති කුල ක්‍රමය පංති ක්‍රමයකට පරිවර්තනය වීම විශ්ලේෂණය කරමින් පන්තිය නිර්මාණය වීම හඳුනා ගැනීම දෙවන අරමුණ වේ.

*සාහිත්‍ය විමර්ශනය*

සිංහල කුල ක්‍රමය පිළිබඳව බටහිර සමාජ විශ්ලේෂකයන්ගේ වැඩි අවධානයක් යොමුව තිබේ. ශ්‍රී ලාංකික විද්වතුන් සැලකිය යුතු සංඛ්‍යාවක් මේ පිළිබඳව පර්යේෂණයන් කර තිබේ. එහෙත් කුලය සහ පන්තිය පිළිබඳව පර්යේෂණ කළ උගතුන් නම් හෝකාර්ට්, 1950 ; එච්. එල්ලාවල, 1962 ; රංජිත් රුබේරු, 1963 ; රැල්ප් පීරිස්, 1964 ; කේ. එම්. ද සිල්වා, 1973 ; මයිකල් රොබට්ස්, 1982 ; ප්‍රැක්ටික් පීබල්ස්, 1995 ; ජයදේව උයන්ගොඩ, 1998 ; එම්.යූ. ද සිල්වා, 1998 ; කුමාරි ජයවර්ධන, 2006 ; නීරා වික්‍රමසිංහ, 2012 ; මාලනී ඇඳගම, 2012 ; එන්.ආර්. දේවසිරි, 2012 ; ඉන්ද්‍රාණි මුණසිංහ, 2012 ; බ්‍රයිස් රයන්, 2015 ; එස්. අර්සරත්නම්, 1964 යන්නන් ඒ අතර කිහිපදෙනෙකි. කුලයට පාරම්පරිකව පැවරී ඇති වෘත්තිය අනුව අන්‍යෝන්‍ය රඳා පැවතීම පවතිනු ඇත. එම්.යූ. ද සිල්වා වැන්නන් සලකනුයේ මෙය හින්දු කුල ක්‍රමයෙන් බිඳී ආවක් ලෙසිනි (ද සිල්වා, 1998). පීරිස් කුල ස්ථරායන පිළිබඳ සවිස්තරව විග්‍රහකර තිබේ. තවද ඔහු රාජකාරිය හා බැඳුණු සේවා ක්‍රමය මැනවින් විග්‍රහ කර ඇත (Peris, 1951). එසේම බ්‍රයිස් රයන්ගේ විග්‍රහයේ දී වැඩවසම් ලක්ෂණවලින් යුත් පාරම්පරික ආයතනයක් ලෙසත් පහතරට දී මේ සංස්ථාව වඩා පෝෂණය වූ බවත්, කෘෂිකර්මයේ නිරතවීමේදී කුල පදනමෙන් තොර වූ බවත්, ප්‍රකාශ කර තිබේ (රයන්, 2015). නවරත්න බණ්ඩාර ප්‍රකාශ කරනුයේ කුලවලට නියමිත සේවා තිබූ අතර කුල භේදයකින් තොරව රජුට රාජකාරී සැපයීම් දක්නට ලැබුණු බවයි. උඩරට සමාජයේ මෙය හොඳින් දක්නට ලැබුණ බවයි (බණ්ඩාර, 2007). පීබල්ස්ගේ

මතය වන්නේ ධනය, බලය මත සකස් වූ මුදලිවරුන් රදල පිරිස සතු ඉඩකඩම්, ඔවුන් නැඟී සිටීම් පිළිබඳව විශ්ලේෂණය කර තිබේ. මොහු යටත් විජිත යුගය තුළ ලංකාවේ මධ්‍යම පන්තිය බිහිවීම මැනවින් විග්‍රහ කර තිබේ (Peebles, 1995). මෙය රොබට්ගේ අර්ථකථනවලින් වෙනස් වේ. මෑතකදී කරන ලද පර්යේෂණයන් අතර මයිකල් රොබට්ස් සඳහන් කර තිබෙන්නේ බ්‍රිතාන්‍ය පාලන සමයේ ලංකාවේ පැවති සමාජ ව්‍යුහය ඊට පෙර පැවති සමාජ ව්‍යුහයට වඩා ද විසිවැනි සියවසේ මුල්භාගයේ පැවති සමාජ ව්‍යුහය දහනවවැනි සියවසේ පැවති සමාජ ව්‍යුහයට ද වඩා වෙනස් වූ බවයි. ජාතික ප්‍රභූන් හා පොදු මහජනතාව අතර විශාල ආර්ථික පරතරයක් ඇති බවයි. එහෙයින් වර්ග, ආගම් හා කුල හා ප්‍රදේශ වශයෙන් බෙදී ඇති බවත් ය. විසිවැනි සියවසේ දෙවන දශකයේ දී කුලය අවියක් ලෙස යොදාගෙන ඇති බවයි. කුලය අතර ගැටුම් පිළිබඳවත් විග්‍රහ කර තිබේ (රොබට්ස්, 1977). රොබට්ස් තම ශාස්ත්‍රිය ලිපියක් මඟින් සමාජය සැකසී තිබෙන ස්ථරායනය පිළිබඳ විග්‍රහ කරනු ලැබේ (රොබට්ස්, 1973). කරාව කුලයේ නැඟීමත්, වැවිලි ආර්ථිකය හා වෙනත් ධනය රැස්කළ ක්‍රම, ප්‍රභූ පැලැන්තිය විශ්ලේෂණය කිරීම් ඇතුළු දත්ත රැසකින් විග්‍රහ කරයි. මාලනී ඇඳගම විග්‍රහ කරනුයේ පැරණි දේශීය ක්‍රමය යටතේ කුල භේදයක් නොව එක්තරා ශ්‍රේණි ක්‍රමයක් තිබූ බවයි. බ්‍රිතාන්‍යයෝ පැමිණීමෙන් මේ ක්‍රමය තුළ අමනාපකම් ඇතිකොට බටහිර පන්නයට ලාංකික සමාජය හැඩගසා ගැනීමට අවශ්‍ය පසුබිම ගොඩනැගූ බවයි. සෑම ක්ෂේත්‍රයක ම උස් පහත්කම් නිර්මාණය කළ බවයි (ඇඳගම, 2015). කුමාරි ජයවර්ධනගේ අදහස වන්නේ බ්‍රිතාන්‍ය යුගයේදී දක්නට ලැබුණේ කුලවල ගැටුම්වලට වඩා පන්ති අතර ගැටුම් පිළිබඳවයි (ජයවර්ධන, 2006). එනම් ධනය, බලය හා අධ්‍යාපනය තුළින් උස්පහත්කම් හා තරගකාරී බව ඇතිකල බව සඳහන් කර තිබේ. ඇය මේ බව මනාව පැහැදිලි කරන්නේ සමාජයේ සිටි සොක්කන් ලෙස පෙනී සිටිය පිරිස ලොක්කන් වූ බව පැවසීමෙනි. නීරා වික්‍රමසිංහ යටත් විජිත පාලනය තුළ සිටි දේශීය ගතානුගතික ආකල්ප දරූ පිරිස පිළිබඳ අදහස් ඉදිරිපත් කර තිබේ (වික්‍රමසිංහ, 2012). කාලයත් සමඟ බොහෝ සාම්ප්‍රදායන් වෙනස්වී නූතනතාවය හා බද්ධවන බව පවසයි. නිර්මාල් දේවසිරිතම ශාස්ත්‍රිය ලිපිය හරහා නව ස්වදේශීය සමාජ පන්තීන් කිහිපයක් පිළිබඳව විමර්ශනය කර ඇත (දේවසිරි, 2012). එහිදී කාලයත් සමඟ දේශපාලන සවිඥාණය වර්ධනයවීමත් හුදු සමාජ පන්තියක අවශ්‍යතාවය සැකසෙනුයේ කිසියම් දෘෂ්ටිවාදයක් මගින් ප්‍රකාශමාන වන බව පවසා ඇත. නෝරා රොබට්ස් ඇයගේ පර්යේෂණය ඔස්සේ ධනය හිමි පන්තියට අයත් පැලැන්තිය පිළිබඳ විශේෂයෙන් ම ගාල්ල ආශ්‍රිතව ජීවත් වූවන් පිළිබඳව අවසාන පරිච්ඡේදයේ විග්‍රහ කර තිබේ (රොබට්ස්, 2015). මහින්ද සෝමතිලකයන් බ්‍රිතාන්‍ය යුගය පිළිබඳ ශාස්ත්‍රීය විග්‍රහයක් කරමින් වතු වගාව ඇසුරෙන් මධ්‍යම පන්තිය නිර්මාණය වීම පිළිබඳ අදහස් දක්වා ඇත (සෝමතිලක, 2018).

මෙසේ පූර්ව පර්යේෂකයන් සිදු කර තිබෙන කුලය පිළිබඳ විග්‍රහයන් සහ බ්‍රිතාන්‍ය යුගය අලලා කර තිබෙන පර්යේෂණයන්ගේ දත්ත වර්ගීකරණය හා විශ්ලේෂණය කරමින් කුලය හා පන්තිය අතර ආකෘතිමය හැඩතලයක් නිර්මාණය කිරීමට ප්‍රයෝජනවත් වේ.

*සීමා සහ අධ්‍යයනයේ වැදගත්කම*

පර්යේෂණයේ සීමාව ලෙස හඳුනා ගන්නේ ශ්‍රී ලංකාවේ සමාජ සන්දර්භය තුළ කුල ක්‍රමය කෙටියෙන් හඳුන්වා දෙමින් බ්‍රිතාන්‍ය යුගය තුළ දී පන්ති නිර්මාණය වන ආකාරය කෙරෙහි වැඩි අවධානය යොමු කිරීමත් මෙම පර්යේෂණයේ දී සිදු කර ඇත. පැරණි සමාජය තුළ කුල ක්‍රමය සමාජ සංස්ථාවක් ලෙස ස්තරායනය වී තිබී කාලයත් සමඟ එය අභාවයට යාම නිසා පුද්ගලයාට නිදහස්ව නැඟී සිටීමේ අවස්ථාවක් බ්‍රිතාන්‍ය යුගය තුළ දී හිමිවීම වැදගත්ය. කුලය, පන්තිය පිළිබඳ අනාගත පර්යේෂකයෙකුට මෙම පර්යේෂණය අත්වැලක්වීම මෙහි තවත් වැදගත්කමකි.

## 2 ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ සංකල්පයන්ට අනුව අභිමතාර්ථ හා පර්යේෂණයේ සොයා ගැනීම් සිදු කරනුයේ සමාජ විද්‍යාත්මක පර්යේෂණ සිද්ධාන්තයක් වන ගුණාත්මක පර්යේෂණ (Qualitative research method) ක්‍රමය මගිනි. මෙහි දී පුස්තකාල සහ ජාතික ලේඛනාගාරය ඇසුරින් ප්‍රාථමික සහ ද්විතීය මූලාශ්‍ර මගින් ද සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් දත්ත එක්රැස් කරගැනීම සිදු කෙරිණි. එහි දී ගැඹුරු සම්මුඛ සාකච්ඡා ක්‍රමයේ දී (In-Depth Interview) භාවිත වන ප්‍රධාන ප්‍රවේශ දෙකක් නම් සංසිද්ධි අධ්‍යයනය (Phenomenology studies) සහ වාචික ඉතිහාසය (Oral history) යටතේ තෝරාගත් පුද්ගලයන් වෙත ගොස් දත්ත එක්රැස් කර ගත්තෙමි.

වර්තමානයේ පර්යේෂණ නිබන්ධයේ විෂය මූලික ප්‍රාමාණික දැනුමක් සහ අත්දැකීම් සහිත උගතුන් තෝරා ගැනිණි. එනම් පර්යේෂකයාගේ ප්‍රස්තුතයට සම්මුඛ පරීක්ෂකවරයා (Interviewee) පමුණුවා ඒ පිළිබඳව දීර්ඝව ප්‍රශ්න ඇසීම සිදු කෙරිණි. මෙහි දී එකින් එක ප්‍රශ්න ඇසීමේ ක්‍රමය (conducted one-on-one) සහ විවෘතව ප්‍රශ්න කිරීමේ ක්‍රමය (utilize open-ended questioning) භාවිත වුණි. එනම් ගුණාත්මක දත්ත රැසක් අරමුණුගතව නැතහොත් විෂය මූලිකව (Subjectively) ලබා ගැනීමට හැකිවිය. පුස්තකාල, ලේඛනාගාර තුළින් සහ සම්මුඛ පරීක්ෂණ ක්‍රමය මගින් එක්රැස් කළ දත්තයන් ද ඒකරාශි කරගෙන ඒවා ගුණාත්මක පර්යේෂණවල පූර්ව කේතනය (Priori Coding Method) මගින් විශ්ලේෂණය කරමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී.

## 3 ප්‍රතිඵල සහ සාකච්ඡා

කුල ක්‍රමය ඉන්දියාවෙන් ප්‍රභවය වූ අතර, ඒ පිළිබඳ මුලින් ම සඳහන් වන්නේ ඍග් වේදයේ පුරුෂ සූක්තයේ ය.[1] සිංහල සමාජයේ කුල ක්‍රමය ක්‍රියාත්මක වූ හා ක්‍රියාත්මක වන ආකාරය විමසීමට පෙර ඉන්දියාවේ එය පැවති ආකාරය සමාලෝචනය කිරීම උචිත වනු ඇත. වේද යුගයේ සිට ඉන්දියාවේ වර්ණ හෙවත් කුල හතරක් නියෝජනය විය. ඒ බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ශූද්‍ර වේ (තිලකසිරි, 1958: 80-85). මෙයින් මුල් ම කුල තුන හඳුන්වා ඇත්තේ ද්විජ කුල (Twice born) වශයෙනි. දෙවරක් උත්පත්තිය සමරමින් උත්සව ගන්නා නිසා ද්විජ කුල ලෙස හඳුන්වා තිබේ.

කුලය යන්න සෑදී ඇත්තේ පෘතුගීසී භාෂාවේ එන කාස්ටා (Casta) යන පදය මුල් කරගෙනයි. ඉන්දියානු සමාජයේ පැවති ස්ථරායන ක්‍රමය දැක්වීම පිණිස පෘතුගීසීන් විසින් එම පදය ව්‍යවහාරයට ගෙන ඇත්තේ දහසය වැනි සියවසේදී ය (රයන්, 2015 : xix). ඉන්දියාවේ කුලය (Caste in India) යන සම්භාව්‍ය කෘතිය ලියූ ජේ.එච්. හටන් (J.H. Hutton) උපුටා දක්වමින් මානව විද්‍යාඥයෙකු වූ ඊ.ආර්. ලීච් (E.R. Leach) ඉන්දීය කුල ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පහත සඳහන් ආකාරයෙන් පෙන්වා දෙයි.

i. කුලයට අයත් සාමාජිකයින් එම කුලයෙන් ම විවාහ වීම.
ii. විවිධ කුලවල සාමාජිකයින් එකට ආහාර ගැනීම පිළිබඳ තහංචි පැවතීම.
iii. කුල අතර ධූරාවලී ක්‍රමයක් දක්නට තිබීම මෙන්ම බ්‍රාහ්මණ කුලයේ අය එහි ඉහළම ස්ථානයේ නියෝජනය වීම.

---

[1] ඍග් වේදය ලියවුණා යැයි විශ්වාස කෙරෙන්නේ ක්‍රි:පූ: 1000 දී පමණය. බලන්න, (Allichin, 1968:47)

iv. පහළ කුල සාමාජිකයින් සමඟ ඍජුව හෝ වක්‍රව ආකාර ගැනීම, ලිංගික චර්යාවේ යෙදීම හා පුද පූජා කටයුතු කිරීමෙන් ඉහළ කුල අපවිත්‍ර වීම.
v. සාම්ප්‍රදායානුගත වෘත්තීන් සමඟ කුල අනන්‍යතා දක්නට තිබීම.
vi. කුලය උපත මුල් කරගෙන නියෝජනය වීම, යම් පූජාමය වරදක් කළ හොත් කුලයෙන් නෙරපීම.
vii. බ්‍රාහ්මණවරුන්ගේ වරප්‍රසාද කේන්ද්‍ර කරගෙන සමස්තයක් වශයෙන් කුල ක්‍රමය පැවතීම (Leach, 1960 : 2-3).[2]

හින්දු ආගමික ග්‍රන්ථවලට අනුව ඒ ඒ කුල වෙන්ව හඳුනාගත හැකි වුවත්, පොදුවේ සංකීර්ණ සංස්ථාවක් වශයෙන් කුලය හැඳින්විය හැකි ය. ගම් මට්ටමේ සාම්ප්‍රදානුගත වෘත්තීවල යෙදී සිටින්නේ මෙම ප්‍රධාන කුල නැත්නම් වර්ණවල උප කුල (Sub caste) යි. ගුර්යේ (Ghurye) ගේ අදහසේ හැටියට ඉන්දියාවේ උප කුල 2000-3000 දක්වා ප්‍රමාණයක් නියෝජනය වේ (Ghurye, 1950). හින්දු ආගමට අනුව පහත් කුලයක ඉපදීම පෙර ආත්මයක කරන ලද කර්මයක (පාපයක) ප්‍රතිඵලය යි. එසේ ම උසස් කුලයක ඉපදීම පසුගිය ආත්මයක කරන ලද යහපත් දෙයක් හේතු වේ.

කුලය පුද්ගලයාගේ උපතත් සමඟ ලැබෙන ආරෝපිත (Ascribed) තත්ත්වයක් ලෙස හැඳින්විය හැකිය.[3] ආහාර ගැනීම් හා ලිංගික කාර්යයන් පදනම් කරගෙන ඒ ඒ කුල අතර වෙනස්කම් දැකිය හැකිය (බංඩාර, 2007:65). ගම් මට්ටමේ කුල ක්‍රමයේ සමාජ දුරස්ථභාවය (Social distance) ක් දැකිය හැක්කේ ආගමික පදනම අනුව යි. ඒ දුරස්ථ බව හේතු කොටගෙන ම ඉන්දියාවේ පහත් කුලවලට ළිං, විථි හා නිවාස වෙන්ව තිබෙන බව ඉන්දීය මානව විද්‍යාඥයින් පෙන්වා දී තිබේ. නූතන ඉන්දියාවේ කුල ක්‍රමයෙන් පිටස්තර සමූහය (Untouchables) හඳුන්වන්නේ ඩැලිට් (Dalit) නමිනි.[4]

හින්දු සමාජයේ කුල ක්‍රමය තත්ව සංරක්ෂණවාදී (conservative) සමාජයකට හොඳ නිදසුනක් වේ. ඒ මගින් සංස්ථාපිත බව, ඒකාබද්ධතාව හා ගම් මට්ටමේ ස්වයංපෝෂිත බව හැකිතාක් දුරට ගොඩ නැගේ. මෙහි දී සඳහන් කළ යුතු විශේෂ දෙයක් වන්නේ ඒ මගින් විශාල ජන සමූහයක් සුරා කෑමට අවස්ථාව ලැබෙන නිසයි. නූතන මානව අයිතිවාසිකම් හා කුල ක්‍රමයේ ආකල්ප අතර ප්‍රතිවිරෝධතා නිසා කුල ක්‍රමය නූතන සමාජයට නොගැලපෙන දෙයක් ය යන්න ඇතැම් අයගේ මතය යි.[5]

ලාංකික සමාජයේ කුල ක්‍රමය වර්තමානයේ මෙන් නොව යුරෝපීය ජාතිකයින් පැමිණීමට පෙර ඉන්දියාවේ පැවති තත්ත්වය මෙන් අනම්‍ය ස්වරූපයෙන් දක්නට නොතිබූ බව මෙහිලා සඳහන් කිරීම යුක්ත යුක්ත වේ. ලාංකික සමාජයේ මුල් යුගයේ දී එනම් ක්‍රි. පූ. පළමු වැනි

---

[2] ලංකාවේ කුල ක්‍රමය තුළ මෙතරම් දැඩි සීමාවන් නොමැති බව මෙහි ලා සඳහන් කළ යුතුය. (බලන්න. සිරිවීර, 2012 : 264)

[3] පුද්ගලයෙකු උත්සාහයෙන් ලබා ගන්නා තත්ත්වය සාධිත තත්ත්වය (Achived status) ලෙස සැලකිය හැකිය. මේ සංකල්ප දෙක හඳුන්වා දෙන ලද්දේ ඇමරිකන් මානව විද්‍යාඥ රැල්ෆ් ලින්ටන් (Ralph Linton) ඔහුගේ study of man, 1936 යන කෘතියෙනි.

[4] ඉන්දියාවේ ලේඛනගත ගෝත්‍රවලින් (scheduled tribes) ගම්වලට පැමිණි ජනයාගෙන් හා ඉන්දියාවට සංක්‍රමණය වූ ඇතැම් මුස්ලිම් ජන සමූහවලින් යුත් අය වර්තමානයේ හඳුන්වන්නේ ඩැලිට් (Dalit) නමිනි (Madan, 2005: 26).

[5] හින්දු ආගම මගින් කුල ක්‍රමයේ පැවැත්ම සාධාරණීකරණය කොට තිබීම නිසා නිල වශයෙන් කුල බෙදීම් සඳහා තහංචි දැමිය නො හැකි ය.

සියවසේ දී පමණ කුල ක්‍රමයේ අඩිතාලම වැටුණු බව පෙනේ. මේ පිළිබඳ ඉතිහාසඥයෙකු වූ ඉන්ද්‍ර කීර්ති සිරිවීර මෙවන් අදහසක් ඉදිරිපත් කොට ඇත.

''මෙපරිද්දෙන් ම ආදිම බ්‍රාහ්මී සෙල්ලිපිවල සඳහන් වන පෙහෙකාර (පේශකාර) කුඹල (කුඹල්), කම්මාර (කම්මල්කරු), මනීකාර (රන් රිදී වැඩවල නියුක්ත වූ අය) වැනි රැකියාවන්හි නිරත වූ පිරිස් ද කාලයාගේ ඇවෑමෙන් වෙනම කුල ලෙස වර්ධනය වුහ.[6] එහෙත් මෙම කුල භේදය පරිපූර්ණත්වයට පත් වූයේ කවර කලෙක ද යන්න නිශ්චිත වශයෙන් ම කිව නොහැකි ය (සිරිවීර, 2012 : 264). ''ලංකාවේ බුදු සමයෙහි ඉතිහාසය'' යන කෘතිය ලියු වල්පොල රාහුල හිමියන් සඳහන් කරන අන්දමට 'ප්‍රාග් බෞද්ධ ලංකාවේ සමාජය ඉන්දියාවේ වගේ ම කුල භේද පංති භේද වශයෙන් පැවතිණ (රාහුලහිමි, 2009 : 240). බ්‍රයිස් රයන්ගේ සිංහල සමාජයේ කුල ක්‍රමය කෘතියට පෙරවදනක් සපයන චන්ද්‍ර ශ්‍රී රණසිංහයන්ගේ අදහසට අනුව 'මුල් සමයේ දී මෙරටට හඳුන්වා දී ඇත්තේ බමුණු දහමට අනුගත වූ කුල ක්‍රමයක් වන්නට ඇතැයි අනුමාන කෙරේ. විජය හා ඔහුගේ පිරිවෙර ජනයාගේ භාර්යාවන් වශයෙන් මදුරා පුරයෙන් පැමිණි ක්ෂත්‍රිය වංශික ළඳුන් සමඟ අටලොස් කුලයක ශිල්පීන් පිරිසක් ද, දෙවැනි පෑතිස් රජු සමයේ අටළොස් කුලයක ශිල්පීන් ද මෙහි පැමිණි බව වංශ කථාවලින් අනාවරණය වේ. මෙලෙස ස්ථාපිත වර්ධනය වන්නට වූ කුල ක්‍රමයේ දක්නට ලැබුණු විශේෂත්වය වූයේ එහි මුල් බැස තිබුණු බමුණු ආධිපත්‍යය හා ඔවුන්ගේ පූජා විධි යටපත් ව ක්ෂත්‍රීය ආධිපත්‍යයෙන් යුත් ලෞකික ලක්ෂණ ඉස්මතු වීමය'' (රයන්, 2015 : xxi).

සාම්ප්‍රදායානුගත සිංහල සමාජයේ කුල ක්‍රමය ගැන විමසන විට රුවන්මල් නිඝණ්ටුවට අනුව බමුනන්, රජවරුන්, වෙළඳුන් හා ගොවියන් පැරණි සමාජයේ නියෝජනය වූ බව පෙනේ (රයන්, 2015 : 5). එහෙත් ලංකාවේ කුල ක්‍රමය ව්‍යුහාත්මක අතින් ඉන්දීය කුල ක්‍රමයට වඩා වෙනස් පදනමකින් පරිණාමය වූ බව අසත්‍ය නොවේ.[7] සිංහල ජනයා අතර මුල් තැන හිමිව ඇති ගොයිගම කුලය හා සමානව ද්‍රවිඩ ජනතාව අතර ප්‍රමුඛත්වය ලැබී තිබෙන්නේ වෙල්ලාල කුලයට යි. කඳුරට සමාජයේ ගොවි වංශය උත්තම ස්ථානයෙහි සැළකුණු අතර මොවුන්ට එරෙහිව සිටියේ අඩු කුලයේ අය බව රැල්ෆ් පිරිස් පෙන්වා දෙයි (පීරිස්, 1964 : 188). වැඩවසම් යුගය පැහැදිලිව දක්නට ලැබුණු කන්ද උඩරට කුල ක්‍රමය ඒ තත්ත්වය සමඟ බද්ධව පැවති බව ද අසත්‍යයක් නොවේ. එසේ ම කන්ද උඩරට රාජ්‍යයේ පහළ කුල වශයෙන් සළකන ලද්දේ සන්නාලියන්, පනික්කියන්, බඩහැලයන්, හේනයෝ, බෙරවායන්, කින්නරයන් හා වහම්පුර යන අයයි (පීරිස්, 1964 : 188).

ලංකාවට ආවේණික වූ වැඩවසම් ක්‍රමයක් පැවති යටත් විජිත යුගයේ සිංහල සමාජය සංස්ථාපිත අසමානත්වයකින් යුතු විය. එකල සමාජය ස්ථරීගතව තිබුනේ කුලය හා ඥාතිත්වය මතයි (Kearney & Fernando, 1979 : 29). එසේ ම කන්ද උඩරට වැඩවසම් ක්‍රමය ඉඩම් භුක්තිය හා බැඳී පැවතිණ. එසේ ම වෘත්තීමය කුල ක්‍රමය ඊට අනුකූලව ගමේ කටයුතු මුදල් අර්ථ ක්‍රමයක් නොමැතිව ක්‍රියාත්මක විණ (ද සිල්වා, 1998). කන්ද උඩරට පරිපාලන නිලධාරීන් තෝරා ගැනීමේදී හා සමස්ත ආර්ථික ව්‍යුහය තුළ කුලය ප්‍රධාන වශයෙන් පදනම වූ බව පැහැදිලි ය. රදල හා මුදලි පරිපාලනයේ ඉහළ ම තැන නියෝජනය විය. ගොවිගම කුලයේ අනෙකුත් උප කුල රජයේ වැදගත් අනෙකුත් තනතුරු හොබවන ලදී. ගොවිගම නොවන කුලවල ධූරාවලි පිළිවෙල එතරම් පැහැදිලි නොවුවත් දාහත්වැනි සහ දහඅටවැනි

---

6 වැඩිදුර අධ්‍යයන සඳහා; (එල්ලාවල, 1962 : 131-140); (ලියානගමගේ, අමරදාස සහ ගුණවර්ධන රණවීර, සංස්. 2014: පිටු. 477-482.)

7 මෙයට බුදු සමයේ ආභාසය නිසා සිදු වූ වෙනසක් ලෙස සළකන්නට පිළිවන. එහෙත් වර්තමානයේ භික්ෂු සංඝයා අතර ද කුල භේදයක් දක්නට ඇති බව වල්පොළ රාහුල හිමියන් පෙන්වා දෙයි (රාහුල හිමි, 2009 : 244), එහෙත් මනස සාවද්‍ය වන්නේ කර්මය කුල ක්‍රමයට සම්බන්ධ කර ඇති නිසයි (රයන්, 2015 : 65).

සියවස්වල ඒ කුලවල තත්ත්වය තරමක් වෙනස් වුවත් එය මුහුදුබඩ ප්‍රදේශවල වෙනස්වීම්වලට සමාන කළ නො හැකි ය (ද සිල්වා, 1998 : 202).

මහනුවර යුගයේ තට්ටු තුනකට කුල ක්‍රමය සකස් වී තිබුණු බව පෙනේ.

i. ගොවිගම කුලය
ii. සේවා කුල
iii. පහළ ම කුල (Kearney & Fernando, 1979 : 30)[8]

කරාව, සලාගම සහ දුරාව කුල හැරුණු විට අනෙකුත් සෑම ප්‍රධාන කුලයක් ම කන්ද උඩරට ප්‍රදේශවල දැකිය හැකි ය. කුල ක්‍රමය විවාහ කටයුතුවල දී විශේෂයෙන් උඩරට ප්‍රදේශවල මූලික තැනක් ගන්නා ලදී. රැල්ෆ් පීරිස් පැහැදිලි කරන පරිදි ''කුල රීති'' දැඩි අයුරින් පිළිපැදීම සිදුවූයේ අවාහ-විවාහ කටයුතුවල දී ය. සිය කුලයෙන් බැහැරව හිර ගනුදෙනු කිරීම සම්පූර්ණයෙන් තහනම් ය (පීරිස්, 1964 : 189).

උප කුල ගැන සඳහන් කරන විට කන්ද උඩරට ප්‍රකටව එම උප කුල දක්නට තිබුණත් පහතරට ඒ තත්ත්වය අප්‍රකට ය[9] (රයන්, 2015 : 307). කෙසේ වෙතත් දහහත්වැනි සහ දහඅටවැනි ශත වර්ෂවල කුල ක්‍රමය තුළ ප්‍රබල වෙනස්වීම් දක්නට නොතිබූ බව සඳහන් කළ හැකි ය. එහෙත් විසිවැනි සියවසට පෙර යුරෝපීය නිරීක්ෂකයින් කුලවලට අයත්ව තිබූ අනු පිළිවෙල එකිනෙකට වෙනස් බව පෙනේ (රයන්, 2015 : 85). මෙරට හිටපු පුරාවිද්‍යා කොමසාරිස්වරයෙකු වූ ඒ.එම්. හෝකාර්ට් ප්‍රකාශ කරන පරිදි ලංකාවේ (උඩරට) එවකට උසස් කුල වශයෙන් ඔහු නම් කර ඇත්තේ රාජකීයන්, රදළයින් හා ගොවීන් ය. පහළ කුල ලෙස ඔහු නම් කර ඇත්තේ ධීවරයින්, හේනයන්, කරණවෑමින්, කුඹලුන් යනාදි අයයි (Hocart,1950).

උඩරට ජනතාව කෙරෙහි කුලය කෙතරම් ඔවුන්ගේ ජීවිතවලට බලපෑවා ද කිවහොත් ඒ පිළිබඳ විග්‍රහයක් කළ ඉතිහාසඥවරියක වන ලෝනා දේවරාජා මෙසේ සඳහන් කරයි.

''සෑම මිනිසාටම ඔහුගේ කුල තත්ත්වය වෙනස් නොකළ හැකි උරුමයක් වූ අතර එය ඔහුගේ මුළු සමාජ ජීවිතයම ආලෝකමත් කොට සැළකිය යුතු ලෙස ඔහුගේ චර්යාවද පාලනය කළේය. එපමණක් ද නොව රාජ්‍ය තුළ ඔහුගේ තත්ත්ව ද, ඔහුගෙන් බදු අය කරනු ලැබූ අන්දම ද තීරණය කළ අතර, ඔහුගේ නීතිමය අයිතිවාසිකම් හා යුතුකම් කෙරෙහි ද කුලය බලපෑවේය. වෙන වචනවලින් කිවහොත් උඩරට රාජධානියේ කුල ක්‍රමය ජනතාවගේ ආත්ම සංයත ස්වාධීන සමාජ නියමයක් පමණක් නොව රජය විසින් සුරක්ෂිත කොට පාලනය කොට ස්ථාවර කරන ලද නිල ක්‍රමයක් ද විය (දේවරාජා, 1997 : 78).''
මෙයින් ගම්‍ය වන කරුණක් නම් උඩරට සමාජය තුළ කුලය එහි සමාජ හා සංස්කෘතික ජීවිතයේ සෑම අංශයකටම ඍජුව සම්බන්ධ වූ බවයි. නූතනයේ පවා දළදා පෙරහැරේ ව්‍යුහය දෙස බලන කළ කුලය එහි මධ්‍යගතව නියෝජනය වන බවයි.

කෙසේ වෙතත් කුල ක්‍රමය නම් කිරීමේදී එහි පොදු ස්වභාවයක් නොපෙන්වන බව අමුතුවෙන් කිව යුතු නොවේ. උඩරටට සමගාමීව පහතරට ප්‍රදේශවල ජනවංශයට අනුව කුල

8 රොඩී කුලය ඉන්දියාවේ ශුද්‍ර කුලයට සමාන කිරීමේ වරදක් නො පෙනේ. පැරණි ලංකාවේ චණ්ඩාල කුලයක් ගැන සඳහන් වේ. ඉතා පහත් යැයි සම්මත කාර්යයන්වල මේ අය යෙදී සිටි බව පෙනේ (සිරිවීර, 2012 : 266).

9 ගණනාථ ඔබේසේකර, 'ලංකාවේ ඉඩම් භුක්තිය පිළිබඳ ලියන ලද කෘතියන් තම අධ්‍යයනය කළ 'මැදගම' ගමේ ගොවිගම කුලයට අයත් උප කුල ගණනාවක් ගැන සඳහන් කරයි (Obeysekere, 1967 : 15-16).

විසිහයක් තිබුණු බව සී. ආර් ද සිල්වා උපුටා දක්වමින් කුලසේකර පෙන්වා දෙයි (කුලසේකර, 2012 : 291). කාලයක් ලංකාවේ සිරගතව සිටි රොබට් නොක්ස් උඩරට සමාජය ආශ්‍රයෙන් කුල 15 ක ලැයිස්තුවක් ඉදිරිපත් කොට ඇත (රයන්, 2015 : 102). රයන් තවදුරටත් වාර්තා කරන පරිදි ලංකාවේ කුල ක්‍රමය පිළිබඳ යුරෝපීය නිරීක්ෂකයන් කීපදෙනෙක් උඩරට හෝ පහතරට නියෝජනය කළ කුල ලැයිස්තුවක් පෙන්වා දෙයි. වැලන්ටයින් ප්‍රධාන කුල පහක් යටතේ තවත් සේවක කුල හා පහත් කුල ගණනාවක් පෙන්වා දෙයි. මේ ආකාරයෙන් කෝඩිනර්, ඩේවි, ජෝන් ආමර් යන විදේශිකයන් ඔවුන් දනගත් පරිදි කුල ප්‍රමාණය පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කළත් ඒවායේ නිවැරදිතාව පිළිබඳ ගැටලු ඇත.

රයන්ගේ නිරීක්ෂණයට අනුව ලංකාවේ සමස්ත වශයෙන් (උතුරු ප්‍රදේශය හැර) කුල 25 ක ලැයිස්තුවක් තම කෘතිය මගින් හඳුන්වා දෙයි.[10] කුල අතර ගොවිගම කුලය ප්‍රධාන වූ බව පෙනේ (De Silva, 1981 : 248). එසේ ම සිංහල ජනයා වාසය කරන සෑම ප්‍රදේශයක ම ගොවිගම කුලය නියෝජනය වේ. අනෙකුත් ප්‍රධාන කුලවල උපකුල අඩුවෙන් නියෝජනය වූවත්, උඩරට ගොවිගම කුලයේ උප කුල 09 ක් දැකිය හැකි ය. ඓතිහාසිකව බලන විට පොළොන්නරු යුගයේ ඉහළ ම කුලය ලෙස සැලකුම් ලැබුවේ ගොවිගම කුලයයි (සිරිවීර, 2015 : 259).

රයන් ලංකාවේ කුල ක්‍රමය අධ්‍යයනය කළ සමයේ කුල ධූරාවලියේ ඉහළ ම ස්ථානය හිමිව තිබුණේ ගොයිගම කුලයටයි. මේ අයගේ ප්‍රධාන වෘත්තීය වගා කටයුතු කිරීම වුව ද, එම කුලයේ සැලකිය යුතු කොටසක් වගා කටයුතුවලින් ඈත්ව සිටින බව පෙනේ. නූතන ශ්‍රී ලංකාවේ ගොවිතැන්වල නිරත වී සිටින්නේ ගොයිගම කුලයේ පිරිස් පමණක් නොවේ. සත්‍ය වශයෙන් ම වර්තමානයේ ගොයිගම කුලයේ පිරිස් වෙනත් වෘත්තීයවල යෙදී සිටිති.[11] ගොවිගම කුලය උසස් වුව ද ඒ අය ගම් මට්ටමේ පහළ කුලවල අය සමග සම්බන්ධකම් පවත්වමින් ජීවත් වේ. එහෙත් කන්ද උඩරට විසූ ගොවිගම කුලයේ අය එවන් සබඳතා පවත්වා ඇත්තේ අඩු තරමිනි. නමුත් ගොවිගම කුලයට පහළම කුලවලින් ගරුත්වය ලැබෙන බව කිව යුතුය. බොහෝ ප්‍රධාන උප කුල කන්ද උඩරට ප්‍රදේශයේ දී හමුවන්නේ මහනුවර ආශ්‍රයෙනි. එසේම එම ප්‍රදේශයේ ගොවිගම කුලයේ උසස් අය ලෙස සැලකුනේ රදළ උපකුලයයි. මෙම රදළ උප කුලය උඩරට රාජධානියේ ප්‍රභූ පැලැන්තිය වශයෙන් නියෝජනය විය (කුලසේකර, 2012 : 33).

ගොවි කුලය හැරුණු විට සමාජ තත්ත්වය හා ආර්ථික පදනමින් විශේෂයෙන් පහතරට ජීවත් වූ වැඩි සංඛ්‍යාවක් කරාව කුලයේය.[12] මේ කුල රාශිගතව සිටින්නේ හලාවත, මොරටුව, පානදුර, නල්ලූර්, කළුතර, බේරුවල, මීගමුව, හම්බන්තොට දක්වා වෙරළබඩ තීරයේය (ධර්මබන්ධු, 1962 : vi). බොහෝ විට කරාව කුලයේ සාම්ප්‍රදායානුගත ජීවිකාව වූයේ ධීවර කර්මාන්තයයි (Roberts, 1997 : 233). අපට පසුව පෙනෙන පරිදි විශේෂයෙන් බ්‍රිතාන්‍ය පාලන සමයේ ඔවුන්ට යම් යම් වරප්‍රසාද හිමි වූයේ කතෝලික භක්තිකයන් වූ නිසයි. ආදි කාලීන කුල සංකේත භාවිත කරන එකම කුලය කරාව කුලයයි. ජන්මය අනුව කරාව කුලයේ සමාජ තත්ත්වය ගොවිගම කුලයට වඩා තරමක් පහත්ය යනු පොදු පිළිගැනීමක් තිබුණ ද වර්තමානය වන විට ඒ තත්ත්වය වෙනස් වී ඇතැයි යන්න සාවද්‍ය නොවේ.

---

10 රයන් සඳහන් කළ ඇතැම් කුලවල අනන්‍යතාව හා කාර්යභාරය බෙහෙවින් වෙනස් වී ඇතැයි කිව හැකි ය.

11 නවීකරණ ආකල්ප හේතු කොටගෙන සෑම කුලයකම විශේෂයෙන් තරුණ තමාගේ මුතුන් මිත්තන්ගේ පරම්පරාවෙන් රැගෙන ආ කෘෂිකාර්මික කටයුතු හා ශිල්පීය කටයුතු කිරීම මදිකමක් ලෙස සිතනු ලැබීම ද මෙයට හේතු විය. රජයේ රැකියාවක සිටීම සමාජ හැඩයක් ඇති කරන්නක් ලෙස ඔවුන් සිතනු පෙනේ.

12 කරාව කුලය සඳහා බලන්න; (Tampoe, 1997 : 1-108)

සලාගම කුලයේ අය ද වැඩිපුර ජීවත්වන්නේ ද වෙරළබඩ ප්‍රදේශවලයි. විශේෂයෙන් බලපිටිය, අම්බලංගොඩ යන ප්‍රදේශ ආශ්‍රිතව ඔවුන් ජීවත් වේ. එම කුලයේ අයගේ ප්‍රධාන වෘත්තීය ලෙස සැලකෙන කුරුඳු වගාවට අමතරව වෙනත් වගා කටයුතුවල සහ ව්‍යාපාරවල ද නිරත සාම්ප්‍රදායික කුල ධූරාවලියේ පහත් තැන නියෝජනය වූ සලාගම කුලයේ පිරිස් පසුව ධනවත් වූ බව පෙනේ. මෙම කුලයේ උපකුල හතරක් ගැන රයන් සඳහන් කර ඇත (රයන්, 2015 ፡ 168-169).

පහතරට රා මදින කුලය ලෙස ප්‍රසිද්ධ වී ඇත්තේ දුරාව කුලයයි. ධනවත්කම පැත්තෙන් බලනකල කරාව හා සලාගම කුලවලට වඩා අඩු මට්ටමක් පෙන්නුම් කරයි. ඔවුන් තමන්ගේ සාම්ප්‍රදායානුගත වෘත්තීය අඛණ්ඩව පවත්වාගෙන නොයන බවක් පෙනේ. ගම්බද දුරාව කුලයේ අය ගොවීන් හා කම්කරුවන් ලෙස ද ජීවිකාව ගෙන යනු ලැබේ. දේශපාලන ආර්ථික අතින් දුරාව කුලය එතරම් ශක්තිමත් නොවූවත් ඔවුන් අතර ද ධනවතුන් නැත්තේ නොවේ.

රයන්ගේ අදහසට අනුව 'ආචාරි' නමින් හඳුන්වා ඇත්තේ 'නවන්දන්න' කුලයයි. ඔවුන් රට ඇතුළට මෙන්ම වෙරළ බඩ ප්‍රදේශවල ද වාසය කරනු දැකිය හැකිය. රිදී වැඩ කිරීම, තඹ වැඩ කිරීම හා කම්හල් වැඩ කිරීම ඔවුන්ගේ ගතානුගතික වෘත්තී වේ. එහෙත් කෘෂිකාර්මික කටයුතුවල ද යෙදෙන නවන්දන්න කුලයේ අය සාම්ප්‍රදායික වෘත්තීයට ද මුල් තැනක් දෙයි. මේ කුලයේ අය උසස්ම අය ලෙස සැලකෙන්නේ නැති වූවත් ඔවුන් වැදගත් කුලයට අයත් බව රයන් සඳහන් කරයි (රයන්, 2015 ፡ 173).

රයන් තම කුල ලැයිස්තුවේ සන්නාලි කුලයක් ගැන සඳහන් කළ ද ඔහු පවසන පරිදි නූතන ලංකාවේ එම කුලයට අයත් ජනතාවක් නොමැති බවයි. එහෙත් යුරෝපීය නිරීක්ෂකයන් එවැනි කුලයක් තිබූ බවට වාර්තා කර තිබෙනු පෙනේ. එහෙත් සම්ප්‍රදායික කුල අතරින් එකක් ලෙස එම කුලය හඳුනාගෙන ඇත. හුණු කුලය ගත් විට එහි ජනගහනය අල්පය. ඒ අය වැඩිපුරම ජීවත්වන්නේ දකුණු හා වෙරළබඩ තීරයේය. කන්ද උඩරට ද හුණු කුලය නියෝජනය කරන ගම් කිහිපයක් තිබේ. පහත රට හුණු කුලයේ නාගරික ‍රැකියාවල නිතරවන බව ද පෙනේ.

රෙදි සෝදන ප්‍රධාන කුලය හේන හෙවත් රදා කුලය වේ. සෑම සිංහල ගමකම කුලයට හෝ මෙම කුලය නියෝජනය වූවත් නිර්මාණය වන විට එම කුලයේ අය රජයේ මෙන්ම වෙනත් වෘත්තීන්වල ද නිරත වී සිටිති. ඇතැම් විට ආයතනික මට්ටමෙන් රෙදි සෝදන ස්ථාන බිහිවීමත් සමඟම ඔවුන්ගේ සාම්ප්‍රදායික ‍රැකියා අනන්‍යතාව බිඳ වැටී ඇත. විවාහ චාරිත්‍ර හා වැඩිවියට පැමිණීම සම්බන්ධ කාර්යයන්වලදී රෙදි සෝදන කුලය ප්‍රධාන වේ. වහුම්පුර කුලය සතු කාර්යය වන්නේ හකුරු නිෂ්පාදනය කිරීමයි. මේ කුලයේ පිරිස බෙහෙමින් වාසය කරන්නේ කන්ද උඩරට ප්‍රදේශවලයි. එසේම වහුම්පුර කුලයේ අය රදළයන්ට හා අනෙකුත් ගොවිගම කුලයේ අය වෙනුවෙන් විවිධ සේවා කරනු ලැබේ. පහතරට අභ්‍යන්තර ප්‍රදේශවල වහුම්පුර පවුල් ජීවත් වෙන බව රයන් පෙන්වා දෙයි (රයන්, 2015 ፡ 180).

ශ්‍රී ලංකාව තුළ වෙනස්වන සම්ප්‍රදායානුගත කුල ක්‍රමය ඒ ඒ පළාත්වලට අනන්‍ය වූ ස්වරූපයෙන් පැවතීමට තුඩු දෙන තත්ත්වයන් සීමා වී ඇත. කන්ද උඩරට ක්‍රමය ගත් විට එය සැබැවින්ම තත්ත්ව සංරක්ෂණවාදී මුහුණුවරක් ගෙන තිබේ. එහෙත් බ්‍රිතාන්‍යයෝ රදළ ප්‍රභූවරුන් උසස් කොට නොසැලකූ බවත් ඉංග්‍රීසි සොල්දාදුවන් රටේ පහත් යැයි සම්මත කුලයකට අයත් සාමාන්‍ය වැසියකු අසළින් ගමන් කරන ආකාරයට අසු පිටින් රදල ප්‍රභූවරු අසළින් ද ගරු සරුවක් නොමැතිව ගමන් කර තිබේ (ඇඳගම, 2012፡ 119). මෙසේ කුල භේදය නොසලකා හැරීමක් කර ඇති බව පෙනේ. එනම් බ්‍රිතාන්‍ය යුගය තුළ කුල ක්‍රමය හීන වූ ලක්ෂණ විද්‍යමාන වේ. එසේ වූව ද පහතරට කුල ක්‍රමය පමණක් නොව අනෙකුත් සමාජ සංස්ථා ද වෙනස්වීම්වලට භාජනය වී ඇත්තේ බටහිර ජාතීන්ගේ පාලනයේ බලපෑම් නිසයි.

පෘතුග්‍රීසීන් හා ලන්දේසීන්ට වඩා බ්‍රිතාන්‍ය පාලකයන්ගේ දිගු කාලීන දේශපාලන, ආර්ථික හා අධ්‍යාපන ප්‍රතිපත්ති හේතු කොටගෙන මේ තත්ත්වය සිදු විණි. වර්ෂ 1815 දී ශ්‍රීමත් රොබට් බ්‍රවුන්රිග් යටතේ ඉංග්‍රීසීන් කන්ද උඩරට තමන් නතු කර ගැනීම නිසා සමස්ත ලංකාව ම බ්‍රිතාන්‍ය පාලනයට ගැණින (කුලසේකර, 2012 ፡ 28-34 ; සෝමතිලක, 2018 ፡ 20). ඒ නිසා පහත සඳහන් කරුණු හේතු කොටගෙන ශ්‍රී ලංකා සමාජය සාම්ප්‍රදායිකත්වයෙන් නව මාවතකට පරිවර්තනය විය.

(i) බටහිර ජාතීන් විසින් ශ්‍රී ලංකාව යටත්විජිතයක් බවට පත්කරන විට මෙරට ස්වයංපෝෂිත කෘෂි අර්ථ ක්‍රමයක් පැවතිණ. එහි නිෂ්පාදන පැවතියේ පරිභෝජනයට පමණි. මෙතෙක් පැවති ආර්ථික රටාව වානිජ වැවිලි ආර්ථිකයක් බවට පරිවර්තනය විය.[13] එනම් ව්‍යාපාරික භෝග ප්‍රමුඛ කොටගත් ආනයන අපනයන ආර්ථිකයක් බිහිවුණි. බ්‍රිතාන්‍යයෝ ක්‍රමයෙන් කෝපි, සින්කෝනා, කොකෝවා, තේ, රබර් සහ පොල් වැනි භෝග ප්‍රධාන ආදායම් මාගී බවට පත් කර ගන්නා ලදී. මේවාට අමතරව වෙනත් ව්‍යාපාර හා වෙළඳාම් (ආහාර ද්‍රව්‍ය හා වෙනත් භාණ්ඩ වෙළඳාම, අරක්කු කර්මාන්තය, ගොඩනැගිලි හා නිර්මාණශිල්පය, බැරල් කර්මාන්තය, මිනිරන් කර්මාන්තය) මගින් ද ධනය උපයා ගන්නා පිරිසක් තත් කාලීන සමාජය තුළින් බිහිවිය[14] (රොබට්ස්, 1977 ፡ 21-22). මෙසේ බ්‍රිතාන්‍යයන්ගේ ආර්ථික අවශ්‍යතා සාක්ෂාත් කර ගැනීම පිණිස ලංකාවේ ආර්ථික පරිසරය ගොඩනගා ගත් බව පෙනේ. එනම් බ්‍රිතාන්‍යයන් පැමිණීමට පෙර පැවති යැපුම් ආර්ථිකය පදනම් වී තිබුනේ රාජකාරී ක්‍රමය මතයි (සෝමතිලක, 2018 ፡ 38). රාජකාරී ක්‍රමය වශයෙන් හඳුන්වන්නේ ශ්‍රී ලංකාවේ පැවති පැරණි වැඩවසම් ක්‍රමයයි (ඊරියගම, 2012 ፡ 156). රාජකාරී ක්‍රමයට එරෙහිව නගන ලද තවත් තර්කයක් නම් එමඟින් කුල භේදය උග්‍ර වූ බවයි. එනම් කුල ක්‍රමය, කුල භේදයක් බවට පත්විය. රාජකාරියත් කුලයත් අතර දැඩි සම්බන්ධකමක් තිබුණි[15] (ඊරියගම, 2012 ፡ 158). බ්‍රිතාන්‍යයන් විසින් රාජකාරී ක්‍රමය අවලංගු කිරීමත් සමඟ සමාජ සංචලතාවට බලපෑවේය. බ්‍රිතාන්‍යයෝ ලංකාවේ එවකට තිබු සම්ප්‍රදානුකූල ඉඩම් දීමනා ක්‍රමය වෙනුවට ඉඩම් එකතු කිරීමේ ප්‍රතිපත්තියක් ද ක්‍රියාත්මක කළහ (සෝමරත්න, 2015 ፡ 248). සමහර අවස්ථාවලදී මුදල් උපයාගෙන සිටි ධනවත්භාවය මත සහ නොයෙකුත් බලපෑම් නිසාත් වැඩි වැඩියෙන් ඉඩම් සතු කර ගැනීමට වතු හිමියෝ සමත් වූහ[16] (මුණසිංහ, 2012 ፡ 78). මෙහි ප්‍රතිඵලය වූයේ ඉඩම් හිමි ධනපති පන්තියක් බිහිවීමයි. සමකාලීන ලංකාවේ පැවති විවිධ කුලවල සමහර පිරිස ද මෙම පන්තියට ඇතුළු වූහ (Jayawardena, 2007 : 171-201).[17] මේ ආකාරයට දහනව වැනි සියවස මැද භාගය වන විට වතු ධනවාදය සහ නාගරික සංවර්ධනය සමාජයේ නව ප්‍රතිවිරෝධතා හා ගැටුම් බිහි කරමින් පන්ති ව්‍යුහයේ වෙනස්කම් ඇති කරන ලදී. (Jayawardena,2010:150). තවද නාගරික කම්කරු පන්තියක්, සාපේක්ෂ ලෙස විශාල වතුකම්කරු පිරිසක් සහ වෙළඳුන් සහ වෘත්තිකයන්ගෙන් යුත් ධනේෂ්වර පන්තියක් බිහිවීමට ද හේතු විය. පසු කලෙක වාමාංශික නායකයන් බිහිවීමට ද බ්‍රිතාන්‍ය යුගයේ ආර්ථික ප්‍රතිපත්ති දායක වී තිබේ (Jayawardena, 2007:195-221).

13 වැඩිදුර අධ්‍යයන සඳහා; (ඊරියගම, 2012 ፡ 37-250 ; U.C.H.C, 1973 : 165-189).

14 වැඩිදුර අධ්‍යයනය සඳහා; (Roberts, 1973 : 263-284)


15 ගම පවුල, කුල ක්‍රමය වැනි අනෙකුත් සමාජ, ආර්ථික, සංස්ථා සමඟ ගසට පොත්ත මෙන් සම්බන්ධ වී පැවති බවත් මෙ රාජකාරී ක්‍රමය පෘතුග්‍රිසී, ලන්දේසි පාලන යුගවල දී වෙනස් නොකළ බව මාලනී ඇඳගම පවසයි : U.C.R., 1951, Vol. 9, No. 4, 266-279 pp.

16 බ්‍රිතාන්‍යයෝ ඉඩම් මිලදී ගත් ලැයිස්තුව බලන්න; (හුළුගල්ල, 1965 ፡ පිටු. 52-53.)

17 වැඩිදුර අධ්‍යයනයට; (Roberts, 1973 : 263-284)

දහනවවැනි සියවස දෙවන භාගය වන විට ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණයන් සම්බන්ධව සැලකිය යුතු පිරිසකගේ අවධානය යොමුව තිබීම ද කුල ක්‍රමය අභිබවා පන්තිය නිර්මාණය කර ගැනීමට උපකාරී වූ බව පෙනේ.[18] මේ නිසා ශ්‍රී ලාංකික වැවිලිකරුවෝ රැසක් නිදහසේ ස්වාධීනව තම වැවිලි භෝග වගාවට පෙළඹුනහ. කුලය අනුව කළයුතු සේවා බැම්වලින් පවා මිදීමට මෙය උපස්ථම්භක විණි. එබැවින් යමක් හරි හම්බ කරගත් උදවිය කුලය පසෙකට තල්ලු කරමින් තම තත්ත්වය පන්තිය ඔස්සේ සකසා ගැනීමට උත්සුක වූහ.

(ii) බ්‍රිතාන්‍ය වතු වැවිලි අර්ථ ක්‍රමය නිසා යම් ආකාරයක නාගරීකරණයක් මෙන්ම වාණිජකරණයක් ද ඇති විණ. භාණ්ඩ හුවමාරු අර්ථ ක්‍රමය මඟ හැරී මුදල් අර්ථක්‍රමය හඳුන්වා දෙන ලදී. මේ තත්වයෙන් වඩාත් වාසි සහගත තත්වයන් ඇතිවූයේ ගොවිගම කුලයට වඩා කරාව හා සාලාගම කුලවල පිරිස්වලට ය. බ්‍රිතාන්‍ය යුගයේදී ම පහතරට වෙරළබඩ ප්‍රදේශවල බෙහෙවින් ම ව්‍යාප්තව සිටියේ කරාව කුලයේ අයයි (Roberts, 1982 : 14). කරාව කුලයට අමතරව ගොවිගම කුලයේ අලුත් ධනවතුන් හා පැරණි ධනවතුන් ලෙස පැලැන්තියක් සමාජයට එක්විය (Jayawardena, 2007 : 190-199). මෙම කරාව කුලයේ ධනපති පන්තිය ක්‍රියාශීලි වූව ද කාර්මික පන්තියක් නොවන බවත් තම පන්තියේ කාර්යයන් කුලය මත පදනම් වූ සම්බන්ධතා ජාලයක් මගින් ඉටු කරගත් බවත් සඳහන් ය (Jayawardena, 2007 : 190).




a. b. c.

සිතියම 01. බ්‍රිතාන්‍යන් යටතේ ප්‍රධාන අපනයන බෝග වගා කිරීම (a) දිස්ත්‍රික්ක අනුව තේ වගාවේ ව්‍යාප්තිය (b) දිස්ත්‍රික්ක අනුව රබර් වගාවේ ව්‍යාප්තිය (c) දිස්ත්‍රික්ක අනුව පොල් වගාවේ ව්‍යාප්තිය (මුණසිංහ, 2012, 70,72,74).

බ්‍රිතාන්‍යයන් යටතේ වතු වගාවේ ප්‍රධාන බෝග ලෙස තේ, පොල්, රබර් හි ව්‍යාප්තිය රට තුළ පැවති ආකාරය සිතියම 01 පරීක්‍ෂා කිරීමෙන් මැනවින් හඳුනාගත හැකි වේ. එනම් එයින්

[18] කුලය, පන්තිය සඳහා බලන්න; (Jupp, 1978 : 27-55)

ප්‍රදර්ශනය වන්නේ වෙරළබඩ තීරය මේ වගා සඳහා ප්‍රමුඛ වූ බවයි. පසු කලෙක මධ්‍ය කඳුකරය සිසාරා ව්‍යාප්ත වූ බව අමතක නොකළ යුතුයි. ඊට අනුව බ්‍රිතාන්‍ය පාලනයේ මුල් යුගයේ දී විශාල ධනයක් රැස්කරගත් සැලකිය යුතු ප්‍රජාවක් ජීවත් වූයේ මුහුදුබඩ ආශ්‍රිතව බව උපකල්පනය කළ හැකිය. නිදර්ශනයක් නම් කරාව ආශ්‍රිත ධනවතුන් වැවිලි රැසකට දායක වූවන් බවත්, ධනපති පන්තිය නියෝජනය කළ බවත් කිව යුතුය.

(iii) ඉංග්‍රීසි භාෂාව මධ්‍යගත කොටගත් බටහිර අධ්‍යාපන ක්‍රමය මේ රටට හඳුන්වා දුන්නේ ද ඉංග්‍රීසි පාලකයන් විසිනි.[19] කුල ක්‍රමය පන්ති ක්‍රමයකට පරිවර්තනය වීම කෙරෙහි බටහිර අධ්‍යාපනය මූලික හේතුවක් වූ බව මෙහිලා සඳහන් කළ යුතුය. ගොවිගම කුලයේ අයට පමණක් නොව, ඊට පහළ කුලවලට ද නව අධ්‍යාපනය ලබා ගැනීමට ඉඩකඩ පැදින. ඉංග්‍රිසි භාෂාව මාධ්‍ය කොටගත් පාසල් ද ඇති කරන ලද අතර, දැඩි ද්විභාෂික ප්‍රබුද්ධ පන්තියක් ද (Bilingual Elite) මේ රටේ බිහි විය. මධ්‍යම පන්තියක් බිහිවීම කෙරෙහි ද මේ තත්ත්වය බලපාන ලදී. මේ යටතේ කුල ක්‍රමය තව දුරටත් හීන තත්වයට පත්විණ. අධ්‍යාපන නවීකරණය මගින් මේ රටේ සමස්ථ සමාජ ජීවිතයේ වෙනසක් ඇති වූ බව පෙනේ[20] (Andradi, 1967: 1st chapter).

(iv) බ්‍රිතාන්‍යයින් මෙරටට පැමිණීමට පෙර පැවති පරිපාලන ක්‍රමයට වඩා කාර්යක්ෂමතාව අතින් මූලික නිලබලවාදී පාලන ක්‍රමයක් හඳුන්වා දීම තුළින් විශාල පිරිසකට රජයේ රැකියා ලබා ගැනීමට අවස්ථාව සැළසිණි (මෙත්තානන්ද, 2012: 359). එම අවස්ථාව ඇති වූයේ වතුවැවිලි අර්ථ ක්‍රමය නිසයි. අධ්‍යාපන සුදුසුකම් ඇත්නම් ඕනෑම කුලයක අයට රජයේ රැකියාවක් ලබා ගැනීමට හැකියාව ලැබිණ. කුල ක්‍රමය පන්ති ක්‍රමයට පරිවර්තනය වීමේදී මෙය ද ප්‍රධාන හේතුවක් විණ.

(v) පැරණි සිංහල රජ සමයේ පැවතියේ ඒකාධිපති රාජාණ්ඩු ක්‍රමයකි. නමුත් ඉංග්‍රීසීන් මෙරටට හඳුන්වා දුන්නේ වෙස්මිනිස්ටර් ආකෘතිය (Wesminister Model) පදනම් කරගත් පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයකි. මහජන ඡන්දයෙන් පත්වන නියෝජිතයන් තෝරා ගැනීම පදනම් කරගත් ප්‍රජාතන්ත්‍රවාදය මගින් ඕනෑම කුලයක අයෙකුට ඡන්දය දීමේ අවසර ලැබීම මගින් ද කුල ක්‍රමය පරිහානියට පත්වීමට හේතු විය. ඩොනමෝර් කොමිෂම යෝජනා මගින් අවුරුදු 21ට වැඩි ඕනෑම කෙනෙකුට ඡන්දය පාවිච්චි කළ හැකිවිය.

බ්‍රිතාන්‍ය පාලකයින් කුල ක්‍රමයට එරෙහිව නීතිරීති පැණවූයේ නැත. නමුත් ගොවිගම කුලයට පමණක් ම රැකියා දීම ඉංග්‍රීසි යටතේ සිදු වූයේ නැත. කරාව, සලාගම[21] මෙන්ම දුරාවේ කුලයට අයත් පිරිසට ද ඉංග්‍රීසි පාලනය යටතේ රැකියා ලබා ගැනීමට පමණක් නොව විවිධ ව්‍යාපාර කරගෙන යාමට ද බාධාවක් නොවීය (Peeples, 1995 : 189-193). මෙම කුලවල පිරිස කතෝලික ආගම වැළඳ ගැනීම නිසා තවදුරටත් ඔවුන්ට බ්‍රිතාන්‍ය පාලකයින්ගේ අනුග්‍රහය ලැබිණ. මේ තත්ත්වය හේතු කොටගෙන ඔවුන්ගේ කුල අනන්‍යතාව අබිභවා පන්ති අනන්‍යතාව ඇතිවිය.

---

19 බ්‍රිතාන්‍යයන් විසින් අපේ රටේ ඉංග්‍රිසි මාධ්‍යයෙන් අධ්‍යාපනය කරගෙන යාමට පටන් ගත්තේ දහනව වැනි සියවසේ මුල් භාගයේ සිටයි.

20 බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ අධ්‍යාපනය සඳහා බලන්න (Yogasundram, 2006 : 221-293 ; Wickramaratne, 1973 : 165-186 ; Jayaweera, 1973 : 461-475 ; Ruberu, 1963 : 71-83 ; Hulugalla, 1969, 484-490).

21 සලාගම කුලයේ අයට ලන්දේසින්ගෙන් ද වරප්‍රසාද ලැබිණ. සලාගම කුලයට පෙර නොවූ පරිදි පහසුකම් ලැබුණේ කුරුඳු වගාවයි. එම කුලයේ අයගේ කැපවීම නිසා ම ඉඩම් බදු වලින් ද ඔවුන් නිදහස් කරනු ලැබිණි.

සාම්ප්‍රදායික සමාජයේ කුල ක්‍රමය ආරක්ෂා කිරීමේ පවුර බවට පත්ව තිබුණේ විවාහය හා පවුලයි. පවුල පිළිබඳ සිංහල ජනයා අතර පවතින ආකල්ප වර්තමානයේදී කුල ව්‍යුහය සංරක්ෂණය කිරීමෙහිලා, ඉතාමත් ප්‍රබල ආකාරයට නැගී සිටියි' යනුවෙන් රයන් වාර්තා කොට ඇත (රයන්, 2005 : 38). කුලය මෙසේ ඉංග්‍රිසි පාලන සමයේ යම් යම් වෙනස්වීම්වලට භාජනය වූවද ගම්බද ප්‍රදේශවල තවමත් ක්‍රියාත්මක වන බව යතාර්ථයකි. සාම්ප්‍රදායික ස්ථරායන ක්‍රමය ගම්බද වුවද පවතින්නේ යම් තරමකට වෙනස් වූ ස්වභාවයකිනි.
ඉහතින් සඳහන් කළ පරිදි ගොවිගම කුලයට වඩා ආර්ථික වශයෙන් කරාව, සලාගම හා දුරාව යන කුලවල ජන කොටස් ඉහළින් සිටි බව පෙනේ. 1860-1870 සහ 1910-1915 යන කාල වකවානුවල මිණිරන් කර්මාන්තය වර්ධනය වූ අතර මේ මිනිරන් ආකාරවල වැඩිපුර අයිතිය පහතරට සිංහලයන් සතු විය (Casinader, 1974 : 1-22). විශේෂයෙන් කරාව කුලයේ සාමාජිකයන්ය (Roberts, 1982 : 110). මෙම ක්ෂේත්‍රයේ ඉදිරියෙන් සිටි අතර ඔවුන්ගේ නිජබිම මොරටුව විණ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ හා අනිකුත් ක්ෂේත්‍රයන් වඩා සාර්ථකත්වය ලබා ගත්තේ උඩරට සිංහලයින්ට වඩා පහතරට සිංහල අයයි. ජාතික ප්‍රබුද්ධ තත්වයට පත් කුල අතර ගොවිගම ප්‍රධාන වූවත්, ඒ සමගම කරාව හා සලාගම කුලවල අය මෙන් ම දුරාව කුලයේ අයට ද ඒ අවස්ථාව ලැබිණ. මයිකල් රොබට්ස් වාර්තා කළ ඇති පරිදි වතු වගා හිමියන් වශයෙන් 101 ක් නියෝජනය වූ සිංහලයන්ගෙන් 59 දෙනෙක් නැත්නම් 58.4% ක හිමිකම කරාව කුලය සතුවිය (Roberts, 1997 : 231-232). මෙකල සිටි කරාව හා සලාගම ධනවතුන් කල්පනා කළේ තමන්ගේ සමාජ තත්ත්වය ආරක්ෂා කර ගැනීමට නම් වතුපිටි හා මුදල් පමණක් නොසෑහෙන බවයි. මේ නිසා ඔවුන් තම දරුවන් පිටරටවලට යවා උසස් අධ්‍යාපනයක් ලබා දීමට කටයුතු කරන ලදී. මේ මගින් උගත් ප්‍රබුද්ධ පන්තියක් බිහි වූ අතර තව දුරටත් කුලය හා ඥාතීත්වය පුද්ගලයාගේ සමාජ තත්ත්වයට හෝ පිළිගැනීමට හේතුවක් නොවීය (Fernando, 1979 : 37).

ගොවිගම කුලයේ අයට ද, අරක්කු රේන්ද ව්‍යාපාරයෙන් සෑහෙන ආර්ථික වාසි ලබා ගත්ත ද දහනවවැනි සියවසේ මැද භාගය වන විට එම වාසි වැඩිපුර ලැබුණේ කරාව කුලයේ අයටයි. අරක්කු රේන්ද හිමිකරුවන් වශයෙන් ගොවිගම කුලයට අයත් ගම්මුලාදැනින්ට පසුව එම ව්‍යාපාරය ගෙන යාමට ඉංග්‍රීසි රජයෙන් තහංචි වැටිණ. කුමාරි ජයවර්ධන සඳහන් කරන අන්දමට ඉංග්‍රීසි රජය ගත් තීරණාත්මක ප්‍රතිපත්තිය මෙයට හේතුවිය.

''කිසිම හේතුවක් නිසා විදානේලාට රජයේ රේන්දකරුවන් වීමට ඉඩ නොදිය යුතුය. මෙයට ඉතාම පැහැදිලි හේතුව වන්නේ එසේ කිරීම මගින් ඔවුන්ගේ පෞද්ගලික අවශ්‍යතාවන් හා ඔවුන්ගේ මහජන යුතුකම් අතර ගැටීමක් ඇති වන නිසාය. මෙවැන්නක් ඇතිවීම වැළැක්වීම සෑම විට ම ආණ්ඩුවේ ප්‍රතිපත්තිය විය'' (ජයවර්ධන, 2006 : 66).

1830 ගණන්වල ගොවිගම කුලයේ රේන්දකරුවන්ට එම ව්‍යාපාරයෙන් ඉවත්වීමට සිදුවූයේ මෙම තීරණය නිසයි. මේ තත්ත්වය යටතේ අරක්කු රේන්ද ව්‍යාපාරයේ අධීක්ෂණය ලබා ගැනීමට කරාව කුලයට හැකිවිය (Peeples, 1995 : 145-166). එසේම කරාව කුලයේ අයට රේන්ද ව්‍යාපාරය ගෙන යාමට හා එහි සාර්ථකත්වයට හේතු වූයේ ශිල්පීන්, වෙළන්දන් හා ආණ්ඩුවේ සුළු නිලධාරීන් ලෙස විවිධ වෘත්තින්හි තම පවුල්වල සාමාජිකයින් සිටි හෙයින් ඔවුන්ට වාසි ලැබිණි (ජයවර්ධන, 2006 : 67-68).

බ්‍රිතාන්‍ය පාලනයේ ආරම්භක වකවානුවේදී මුදලිවරුන්ගේ බලය තහවුරු විය. ඔවුන් ගොවිගම කුලයේ සාමාජිකයින් වූ අතර ප්‍රභූ පැළැන්තියක්[22] වශයෙන් ඔවුන් පිළිගැනීමට බ්‍රිතාන්‍ය පාලකයින්ට සිදුවිය. එහෙත් එනම් දහනවවැනි සියවසේ මැද භාගයේ දක්ෂකම් මත පුද්ගලයින් රජයේ තනතුරුවලට පත්කිරීම මගින් ගොවිගම මුදලි පවුල්වල බලතල

22 පහතරට ප්‍රභූ පරපුර බලන්න; (ධර්මබන්ධු, 1962 : 1-336 ; Roberts, 2013 : 397-466)

බෙහෙවින් අඩුවිය. කෙසේ වෙතත් පීබල්ස් (Peebles) සඳහන් කරන්නේ මේ මුදලි පැළැන්තිය නැගී එන මධ්‍යම පන්තියේ මුල් පුරුක ලෙසයි. බස්නාහිර පළාතේ අරක්කු රේන්ද බදු කුලීකරුවන් අතර වැඩිදෙනා මොරටුව ආශ්‍රිත ප්‍රදේශයේ සිටි බව සඳහන් වේ (Roberts, 1997 : 233). නව ප්‍රභූ අතර බහුතරය කරාව කුලයේ ව්‍යාපාරිකයන් සමූහය ලෙස හඳුන්වන්නට පුළුවන (වික්‍රමසිංහ, 2012 : 201). මෙහිදී ප්‍රබුද්ධ පන්තිය කුමක් ද යන්න කෙටියෙන් සඳහන් කිරීම උචිත වනු ඇත.

ප්‍රබුද්ධ (Elite) යැයි සඳහන් කරන විට කිසියම් සමාජයක විශේෂිත පුද්ගලයෙකු හෝ පුද්ගලයන් එම ගණයට වැටේ යැයි කිව නොහැකිය. සමාජයේ අනෙකුත් අයට අවශ්‍ය, එසේම එම සමාජයේ බලපෑම් කළ හැකි සහ නායකත්වයට සුදුසු පුද්ගලයා ප්‍රභූ අයෙකු වශයෙන් සලකන්නට පුළුවනි. එය තත්ව ඇගයීම් ක්‍රමයක් ලෙස ද හඳුන්වන්නට බැරිකමක් නැත. නිර්ණායකයන් දෙකක් යටතේ 'ප්‍රබුද්ධ' සංකල්පය විග්‍රහ කළ හැකිය. ඒ බලය (Power) හා තත්ත්වය (statius) අනුවයි. අසාමාන්‍ය ලෙස ධනයක් තිබීම, දේශපාලන බලය පාලනය කිරීම, සමාජීය අගනාකමක්, සැළකිය යුතු ආධිපත්‍යයන් සතු නිල තනතුරු දැරීම යන ලක්ෂණ අනුව එවැනි සමූහ හෝ පන්ති ප්‍රබුද්ධ පන්ති වේ. එසේම තත්ත්වය පදනම් කරගෙන සුවිශේෂ ජීවන රටාවක් තිබීම, අනෙකුත් පුද්ගලයන්ට වඩා සුවිශේෂීව ආකර්ශනීය පරිභොජන රටාවක් තිබීම, ඉහළ සමාජ තත්ත්වයක් තිබීම, එය කුලය හෝ පන්තිය විය හැකිය. එසේ ම සංස්කෘතිකමය හා බුද්ධිමය නියෝජනය වීම ප්‍රබුද්ධ ගණයට වැටෙන පුද්ගලයින් සතු වේ.

සිංහල සමාජයේ කුල ක්‍රමය බෙහෙවින් අභියෝගයට ලක්වූවේ දහනවවැනි සියවසේ අගභාගයේ හා විසිවැනි සියවසේ මුල් භාගයේදී ය. ඒ අතර කරාව, සලාගමෙ, දුරාව හා වහුම්පුර යන කුලවල ප්‍රධාන කුලය වශයෙන් සැළකුණ ගොවි කුලයට එරෙහිව වාද විවාද ඇති වූයේ මේ යුගයේදී ය. එසේම මෙකල අවලාද මට්ටමෙන් කුල ගැටුම් පිළිබඳ සාහිත්‍යයක් ගොඩනැගුණු බව පෙනේ. මේ සම්බන්ධයෙන් ආවේගාත්මක ප්‍රකාශන දෙකක් එළි දැක්විණ. එනම්, 'ශුද්‍ර බන්ධන සංකලිය' හා ආරියන් වේ (වික්‍රමසිංහ, 2012 : 200). ගොවිගම නොවන ජනතාව වතු වැවිලි අර්ථ ක්‍රමය මගින් ආර්ථික ප්‍රගතියක් ලබා ගත් අතර එහි ප්‍රතිඵලය වූයේ ආර්ථික අතින් ඔවුන් ගොවිගම කුලයට වඩා ඉහළ තත්වයට පත්වීමයි. තම කුල, ගොවිගම කුලයට වඩා උසස් තත්වයන් නියෝජනය කරන බව විශේෂයෙන් කරාව සලාගම හා නවන්දන්න කුල ඉන්දියාවේ වෘත ක්‍රමය උපයෝගි කොට ගත් බව පෙනේ. ඒ අනුව කරාව කුලයේ අය ක්ෂත්‍රිය වර්ගයට සලාගම හා නවන්දන්ත කුල බ්‍රාහ්මණ කුල (වර්ණ) තත්වයට පත්ව ඇති බව කියා පෑවේය. මේ යටතේ ශුද්‍ර කුලය හා සම මට්ටමට ගොවි කුලය ඇද දැමූ බව පෙනේ (වික්‍රමසිංහ, 2012 : 200).

පහළ යැයි සම්මත කුල සාධනය කරගත් ආරම්භක වර්ධනය ඉහළ කුලය වන ගොවිගම කුලයට අභියෝගයක් විය. පහළ කුලවල අයට ජාතික මට්ටමේ නිලබල ක්‍රමයට ප්‍රවේශවීමේ බාධාවක් ද නොවීය. අධ්‍යාපන වශයෙන් ඔවුන් ලබාගත් දැනුම මගින් විවිධ වෘත්තීන්වලට ප්‍රවේශ වීමට අවකාශ ලැබිණ (Fernando, 1979 : 39). දහනවවැනි සියවසේ අග භාගයේ තමන්ගේ කුල සඳහා ඓතිහාසික සාධක ඉදිරිපත් කළ අවස්ථා ද නැත්තේ නොවේ. බත්ගම බෙරවා කුලයේ අය පහළ කුලයක් ලෙස සාම්ප්‍රදායිකව හඳුන්වා තිබුණත් එය පහළ කුලයක් නොවන බව ඇතැමුන් ඔප්පුකර තිබේ. දහනවවැනි සියවසේ අග භාගයේ පමණක් නොව විසිවැසි සියවසේ මුල් භාගයේ කුල ගැටුම් තිබීම මගින් පැහැදිලි වන්නේ තම තමන්ගේ කුල අනන්‍යතාව රැක ගැනීමටයි. වරෙක එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරයා ප්‍රකාශ කරන්නේ, ''වර්ණභේද වාදය හා කුල භේදය ක්‍රියාත්මක වන සමාජයක සර්වලෝකීය සහෝදරත්වයක් පවත්වාගෙන යා නොහැකි බවයි'' (ද සිල්වා, 2012: 171 ; Barns to Colebrooke 1830, Colonial office 54, 112). වර්ෂ 1947 සෝල්බරි කොමිෂමෙන් ඇතැම් පහළ කුල ඉල්ලා

සිටියේ තමන්ගේ කුලවලට දේශපාලන නියෝජනයක් ලබාදිය යුතු බවයි. දහනවවැනි සියවසට පෙර වෙරළබඩ ප්‍රදේශවල හා කන්ද උඩරට ප්‍රදේශවල නියෝජනය වූ කුල තමන්ගේ සාම්ප්‍රදායික තත්ත්වය තරඟකාරී ඒවා මගින් වෙනස් කිරීමට කල්පනා කළේ නැත. මේ සියල්ල සිදුවුයේ දහඅටවැනි සියවසෙන් පසුවය.[23]

දහනවවැනි සියවසේ අගභාගයේ කුල දූරාවලියේ දෙවැනි උසස් කුලය වශයෙන් සැළකෙන කරාව කුලය ආර්ථික වශයෙන් පමණක් නොව, දේශපාලනික වශයෙන් ද ගොවිගම කුලයට එරෙහිව අභියෝග කළ බව පෙනේ. මුදලි කණ්ඩායමේ ඒකාධිකාරය අවම කරන්නට තැත් කළේ කරාව වෙළඳුන්ගේ පුත්තු හා බෑණාවරු බව ජයවර්ධන සඳහන් කරයි (ජයවර්ධන, 2006 : 448). ජාතික මට්ටමේ ප්‍රබුද්ධයන් ගැන සඳහන් කරන විට රටේ භාණ්ඩ හා සේවාවන්වල සැළකිය යුතු කොටසක පාලනය ලබාගත් කුල ලෙස කරාව, සලාගම හා දුරාව කුල හඳුන්වන්නට පුළුවන. කරාව හා සලාගම කුල මිනිරන් කර්මාන්තයෙන් සැහෙන ආදායම් ලබාගත් අතර ඔවුන්ට ගොවිගම කුලය හා තරග කරන්නන්ට හැකියාව ලැබිණ. දුරාව කුලයේ අයට කොළඹ දේපළ තිබුණු අතර, ඔවුන් වෙළදාමෙන් ද ධනය උපයා ගන්නා ලදි. මෙම ආර්ථික තත්ත්වය අනුව පන්ති සමාජයක ලක්ෂණ ඔවුන් තුළින් විද්‍යාමාන විය (Wright, 1907 : 585-636). විශේෂයෙන් රයන්ගේ අදහසට අනුව නාගරික ප්‍රදේශවල මේ ආකාරයේ පන්ති ක්‍රමයක් දැකිය හැකිවිය. තවද බටහිර ජාතීන්ගේ පාලනය හමුවේ කුල ක්‍රමය ව්‍යාකූල වූ බවත් කුල වැඩ වසම් ක්‍රමය තුළින් සමාජ පන්ති ක්‍රමයක් බිහි වූ බවයි. (ද සිල්වා, 1998 : 79 ; S.L.N.A. 5/5, Nos. 290-291).

කුල ක්‍රමය පන්ති ක්‍රමයට පරිවර්තනය වීමේදී ශ්‍රී ලංකාව බහුසමාජ (Plural Society) ක් බවට පත්වීමට ද හේතුවක් විය හැකිය.[24] සිංහල සාම්ප්‍රදායික කුල ක්‍රමය පැවති සිංහල සමාජය සමජාතීය (Homogeners) සමාජයකි. එවැනි සමාජවල එන ජන කොටසක් එකම ආගමක් අදහමින් ගතානුගතිකව ජීවත් වේ. එහෙත් ලංකාව යටත් විජිතයක් වූ පසු විවිධ ජනවර්ග නියෝජනය කරන බහු සමාජයක් බවට පත් විය. එවැනි පසුබිමක වෙනස් ජන කොටස් සිය ගනුදෙනු කරන්නේ එක් කුලයක් සමග නොවේ. මුස්ලිම් හෝ ද්‍රවිඩ ඇතැම් ජන කොටස්වලට කුල හැඟීමක් නැත. ඔවුන් සිය ආර්ථිකය හුවමාරු කරන්නේ සිංහලයන් සමගය. මෙහි දී පහළ කුලවලට ද ආර්ථික වාසි ඇති වේ. එබැවින් තර්ක කළ හැක්කේ බහු සමාජ ලක්ෂණ කුල ක්‍රමයේ ස්ථායීතාව හීන කරනු ලබයි.

සිංහල සමාජය තුළ කුල ක්‍රමය වර්තමානයේ පවතින තත්ත්වය බ්‍රිතාන්‍ය යුගයට පෙර පැවති තත්ත්වයට සමාන කළ නොහැකිය. සමහර කුල කාලයාගේ ඇවෑමෙන් නැති වී තිබෙන අතර දැනට ක්‍රියාත්ම වන ප්‍රධාන කුල පවා අනන්‍යතාව පිළිබඳ' ප්‍රශ්නවලට මුහුණ පාන බව කිව යුතුය. ප්‍රජාතන්ත්‍රවාදි ආණ්ඩු ක්‍රම හා මානව අයිතිවාසිකම් පිළිබඳ විශේෂයෙන් අවධාරණ යුගයක අප ජීවත් වන නිසා කුල ක්‍රමය තාක්ෂණ හා නවීන සමාජයට උචිත ද යන ප්‍රශ්නය නගන්නට සිදු වේ.

---

23 උඩරට ගොවිගම කුලයට අභියෝග කරන්නට සෙසු කුල උත්සාහ නොකළ අතර ඔවුන් තම කුල තත්වය පිළිමබඳ එතරම් සැලකිල්ලක් නො දැක්වූ බව පෙනේ. ඉන්දියාවේ පහළ කුල විසිදෙකක් කරනු ලබන වෘත්තීන් ගැන ආඩම්බර වූයේ ඔවුන්ගේ වෘත්තීය අනුව වෙනත් උසස් කුලවලට නැති බව වේ.

24 බහුසමාජය යන සංකල්පය පළමුවරට සමාජ ශාස්ත්‍රවලට හඳුන්වා දුන්නේ නෙදර්ලන්ත ඉන්දියාව (ඉන්දුනීසියාව) ආශ්‍රයෙන් ජේ.එඩ්. ෆර්නිවල් (J.H. Furnival) ය. ඔහු සමාජය නිර්වචනය කොට ඇත්තේ එකම භූගෝලීය ප්‍රදේශයක විවිධ ජාතීන් නියෝජනය කරන යනුවෙනුත් භාෂා කතා තරග, විවිධ ආගම් අදහන එකම දේශපාලන අධිකාරියක වෙසෙන ජන කොටස් ලෙසිනි (Furnival, 1947).

කුලයේ ඓතිහාසික කාර්යභාරය වර්තමානයේ සීමාවී ඇත්තේ ඇතැම් සංස්ථාවලට සම්බන්ධවය. නිදසුනක් වශයෙන් මානව පවුලේ විශේෂ සිද්ධීන්වල දී යම් යම් කුලවල අවශ්‍යතාව පවතී. ගැහැනු ළමයකුගේ මල්වර කටයුතු කිරීමේ දී, විවාහ අවස්ථාවල දී, රෙදි සෝදන කුලයේ සේවය අවශ්‍ය වේ. ගම්බද ප්‍රදේශවල පමණක් නොව නගරබද ප්‍රදේශවල ද මෙවැනි අවස්ථාවන්හි ඉහත සඳහන් කුලය සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරන බව පෙනේ. කුලය ගැන එතරම් සැළකිල්ලක් නොදක්වන බව ද සඳහන් කළ යුතුය. කෙනෙකුගේ කුල තත්ත්වය කෙබඳු ද යන්න යාන්තමින් හෝ දැනගත හැක්කේ ඔහුගේ වාසගම මගිනි (මායාදුන්න, 2018 ඃ 308).

දහවැනි සියවසේ අගභාගයේ සිට මෙසේ පන්තියක් ගොඩනැගුනේ කුල ක්‍රමය අභියෝගයට ලක් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි. සමාජ විද්‍යාඥයින්ගේ අදහසට අනුව වර්තමානයේ දකුණු ආසියාවේ සමාජවල කුලය අභිබවා පන්තිය ඉස්මතු වී ඇත.[25] එක සමාන සමාජ ආර්ථික අවශ්‍යතාවයන් භුක්ති විඳින සමූහය පන්තිය ලෙස හැඳින්විය හැකිය. ලංකාවේ ධනේශ්වර පන්තියේ මූලාරම්භය දහනවවැනි සියවසේ අවසාන දශක දෙක තුන ගොඩනැගුණ අතර, මෙහිලා ගොවිගම කරාව කුල ප්‍රමුඛත්වයක් ගත් බව සඳහන් කළ යුතු ය. ජාතික දේශපාලනයේ දී මන්ත්‍රී ධූර සඳහා පන්ති අතර ගැටුම්වලට[26] අමතරම එකම පන්තිය තුළ ගැටුම් ඇති වූ බව සඳහන් කළ යුතුය. ඒ කරාව කුලයේ ධනේශ්වරයන් අතරයි (ජයවර්ධන, 2006, 409).

මේ ආකාරයට දහනවවැනි හා විසිවැනි සියවස් තුළදී සිදු වන ආර්ථික අධ්‍යාපන වෙනස්වීම් සමඟ දේශපාලන ක්ෂෙත්‍රයට වැදගත් වන නව කණ්ඩායමක් බිහි වේ (Kearney, 1967 : 23). මොවුන් අනාගත ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය හා දායක වූ බව පැහැදිලිය. නිදර්ශන ලෙස ජේම්ස් පීරිස්, මාකස් ප්‍රනාන්දු, පොන්නම්බලම් අරුනාචලම්, පොන්නම්බලම් රාමනාදන්,[27] මුත්තු කුමාරස්වාමි සහ එස්.සී. ඔබේසේකර කිහිප දෙනෙකි. මෙසේ ධනය උපයා ගෙන උගත්කම ලබාගත් කරාව, සලාගම කුලවල අය පවා ලංකාවේ දේශපාලන ව්‍යාපායේ ධනාත්මක ඉදිරි පියවරකට අත්වැල් බැඳගෙන සිටි පිරිසක් වූහ (Peebles, 1995 : 189-193).

සිංහල සමාජය තුළ කුලය ඓතිහාසික අනන්‍යතාවයකින් යුතු ව ගොඩනැගුණු අතර එම කුල ක්‍රමය බ්‍රිතාන්‍යයන් මෙරටට පැමිණෙන තුරු අභියෝගයට ලක් වූයේ නැත. බුදු දහම කුල ක්‍රමය ප්‍රතික්ෂේප කළ ද ලංකාවේ සිංහලයන් අතර කුලය හැඟීම්බර (sensitive) සංස්ථාවක් වශයෙන් ක්‍රියාත්මක වුණි. රැල්ෆ් පීරිස් පෙන්වා දෙන පරිදි කුලය කන්ද උඩරට සමාජයේ ස්ථිරව පැවතුණ අතර කුල සම්බන්ධව තහංචි ද තිබිණි (පීරිස්, 1964 ඃ 181-191).

**නිගමනය ඃ**

මෙසේ බටහිර ජාතීන් ලංකාව යටත් කරගැනීමට පෙර සිට ම පැවැති කුල ක්‍රමය කාලයක් සමඟ වෙනස් වීම් වලට භාජනය වී ඇත. විශේෂයෙන් ම බ්‍රිතාන්‍යයන් හඳුන්වා දුන් ආර්ථික ක්‍රමයන්ට අනුගත වූ බොහෝ ලාංකිකයෝ ධනයෙන්, බලයෙන්, තත්ත්වයෙන් හා අධ්‍යාපනයෙන් ආඪ්‍ය වී සමාජ සන්දර්භය තුළ උසස් භාවයක් ලබා ගැනීමට හැකියාවක් ලැබුණු බව මෙම පරීක්ෂණයේ දි ගම්‍ය විය. සමාජ පන්තින් දහනවවැනි සියවසේ මැද

[25] එහෙත් ඉන්දියාවේ බොහෝ විට කුලය තමවත් ප්‍රධාන සමාජ ස්ථාරායන ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වන්නේ එහි ගම්වලයි.

[26] මෙම පන්ති ගැටුම කාල් මාක්ස් පැහැදිලි කළ ධනේශ්වරයන් හා කම්කරුවන් අතර පවතින පන්ති ගැටුම නොවේ.

[27] බලන්න; (Vythilingam, 1977: Ramanathan of Ceylon. The Life of Sri Ponnambalam Ramanathan)

භාගයේ සිට වර්ධනය ආරම්භ වී විසිවැනි සියවස වන විට කුලය අභිබවා යමින් මේ සමාජ පන්තීන් අතර ස්වදේශීය ධනපති පන්තිය, සුළු ඉඩම් හිමි පන්තිය හා නාගරික කම්කරු පන්තියක් බිහි විය. මෙම පන්ති විසිවැනි සියවස වන විට ශාඛා ප්‍රශාඛාවලට බෙදුනි. මොවුන් බ්‍රිතාන්‍යයන්ගේ ආර්ථික ප්‍රතිපත්තියෙන් ඵල ප්‍රයෝජන ලබා ධනය රැස්කර ගනිමින් තම දෙවන තෙවන පරපුරවලට ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා දෙමින් (සමහරෙකු පිටරට යවා හෝ) බටහිර ඌරුවට අනුව හැඩ ගැසෙමින් නව සමාජ අනන්‍යතාවයක් ගොඩ නඟා ගනිමින් නව මාවතක් විවර කරගත් පිරිසක් ලෙස හඳුනාගත හැකිය. මොවුනට කුලය වැදගත් නොවීය. ආර්ථික හා සමාජීය වශයෙන් තත්ත්වයක් හිමි කරගත් මෙම ජන කොටස විසිවැනි සියවස තුළ දී බ්‍රිතාන්‍යයන් යටතේ දේශපාලන ව්‍යාපාරයන්ට යොමුවීමක් ද වූ බව පැහැදිලි විණි. කිසිදු විටක මොවුන්ගේ දේශපාලන ව්‍යාපාරය සටන් මාවතකට විවර නොවූ බව සැබෑය. එහෙත් කුල භේදය අභිබවා පන්තිය ඉස්මතු වී පසු කාලීන දේශපාලන ක්ෂේත්‍රයේ පතාක නායකයන් බිහිවීමට මෙම පසුබිම උපස්ථම්භක වූ බව කිව යුතුය. මෙසේ බිහි වූ සාමාජිකයින් ගතානුගතික වාදීන් (conservatives) මධ්‍යස්ථවාදීන් (moderates), රැඩිකල්වාදීන් (radicals) යනුවෙන් නිර්මාල් දේවසිරි වර්ගීකරණය කර ඇත (දේවසිරි, 2012: 410). එසේම විසිවැනි සියවස වනවිට බිහිවන ඉංග්‍රිසි උගත් පන්තිය ''බුද්ධි ජීවීන්'' (intelligentsia) ලෙස ශක්තිමත් පදනමක් ලබා සිටින ජන කොටසක් බව සඳහන් වේ (බණ්ඩාර, 2007: 196). මෙම පිරිස බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය වාදයට එරෙහිවත්, සමාජවාදී හා කොමියුනිස්ට්වාදී අදහස්වලින් පෝෂණය ලබා ලාංකික දේශපාලන ක්ෂේත්‍රයට වෙනස් ම සංකල්ප ඇතුළත් කළ පිරිසක් ලෙස හඳුනාගැනීම යුක්ති යුක්තය. කිසියම් පුද්ගලයකුට පහළ සිට ඉහළට ගමන් කළ නොහැකි වූ කුල ක්‍රමය (බ්‍රිතාන්‍ය යුගයට පෙර පැවැති) බ්‍රිතාන්‍ය යුගයේ දී නිර්මාණය වන පන්ති ක්‍රමය තුළ ප්‍රබල වෙනසක් කළ බව සනාථ විය. මේ ආකාරයට සාම්ප්‍රදායික කුල බැඳීම් කඩා දමමින් අලුත් හැඩ තලයකින් ක්‍රම ක්‍රමයෙන් කුලය දියාරු වී පන්තිය ඉස්මතු වූ බව මෙම පර්යේෂණයේ දී උකහා ගත හැකි මුඛ්‍ය සාධකය වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

ඇදගම, මාලනී. (2012) ව්‍යවස්ථාමය හා දේශපාලන සංවර්ධනය, **ශ්‍රී ලාංකේය ඉතිහාසය**, වෙළුම V, සංස්කරණය - ඩබ්.එම්.කේ.විජේතුංග, කොළඹ, එම්.ඩී. ගුණසේන සහ සමාගම. පිටු. 89-140.

_____, (2012). ''යටත් විජිත වාදයේ ව්‍යාප්තිය හා ස්වදේශීය ප්‍රතික්‍රියා'', **ශ්‍රී ලංකේය ඉතිහාසය**, වෙළුම iv, සංස්කරණය - ඩබ්ලිව්.එම්.කේ.විජේතුංග, කොළඹ, ගුණසේන සහ සමාගම, 113-150 පිටු.

ඊරියගම, තිස්ස. (2012) **නූතන ආර්ථික ඉතිහාසය, ශ්‍රී ලංකාව**, නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ.

එල්ලාවල, එච්. (1962) **පුරාතන ලංකාවේ සමාජ ඉතිහාසය**, කොළඹ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,

කුලසේකර, කේ.එම්.පී. (2012) උඩරට සමාජ සංවිධාන, **ශ්‍රී ලාංකේය ඉතිහාසය**, වෙළුම III, සංස්.- ඩබ්.එම්.කේ. විජේතුංග, කොළඹ, එම්.ඩී. ගුණසේන සහ සමාගම, පිටු. 285-310.

ජයවර්ධන, කුමාරි. (2006). **සොක්කන් ලොක්කන් වූ වගයි**, කොළඹ, සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

තිලකසිරි, ජේ. (1958) **සංස්කෘත සාහිත්‍ය වංශය**-කාණ්ඩය I, වෛදික සාහිත්‍ය, කොළඹ, ලේක්හවුස් ඉන්වෙස්මන්ට්ස් ලිමිටඩ්.

ද සිල්වා. එම්.යූ. (2012). ''යටත් විජිත පාලන ව්‍යුහයන් ස්ථාපිත කිරීම'', **ශ්‍රී ලාංකේය ඉතිහාසය,** වෙළුම iv, සංස්කරණය - ඩබ්ලිව්.එම්.කේ. විජේතුංග, කොළඹ, ගුණසේන සහ සමාගම, 151-182 පිටු.

_____, එම්.යූ. (1998). **කුල වැඩවසම් ක්‍රමය**, කඩවත, අභය මුද්‍රණ ශිල්පියෝ සහ ප්‍රකාශකයෝ.

දේවරාජා, ශ්‍රීමතී. ලෝනා. (1997) **උඩරට රාජධානිය (1600-1782)**, (පරි.) කුසුම් දිසානායක

පාදුක්ක, රජයේ මුද්‍රණ සංස්ථාව.

දේවසිරි, නිර්මාල්. රංජිත්. (2012) **''පොදු ජන ව්‍යාපාර බිහිවීම හා විකාශය''**, ශ්‍රී ලාංකේය ඉතිහාසය, වෙළුම iv, සංස්කරණය.- ඩබ්ලිව්.එම්.කේ.විජේතුංග, කොළඹ, ගුණසේන සහ සමාගම, පිටු. 399-430.

ධර්මබන්ධු, ටී.ඇස්. (1962) **කෞරව වංශ කථාව**, මොරුව, දොඩන්ගොඩ සහ සමාගම.

පීරිස්, රැල්ෆ් (1964) **සිංහල සමාජ සංවිධානය**, කොළඹ, සීමාසහිත සමන් ප්‍රකාශකයෝ.

බංඩාර, ඒ.එම්.එන්. (2007) **බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරය**, කොළඹ, ෆාස්ට් පබ්ලිෂින් (ප්‍රයිවට්) ලිමිටඩ්.

මායාදුන්න, මිලින්ද. (2018). **සමාජ විද්‍යාවේ මූලිකාංග**, කොළඹ, ගොඩගේ සහ සහෝදරයෝ.

මෙත්තානන්ද, තිලකා. (2012). ''ව්‍යවස්ථාමය ප්‍රතිසංස්කරණ හා නිදහස කරා ගමන් කිරීම'', **ශ්‍රී ලාංකේය ඉතිහාසය,** වෙළුම iv, සංස්කරණය - ඩබ්ලිව්.එම්.කේ.විජේතුංග, කොළඹ, ගුණසේන සහ සමාගම, පිටු. 355-398.

මුණසිංහ, ඉන්ද්‍රනී. (2012) ''වතු ආර්ථිකය සහ ඒ හා සම්බන්ධ අනිකුත් ආර්ථික වර්ධනයන්'', **ශ්‍රී ලාංකේය ඉතිහාසය,** වෙළුම iv, සංස්කරණය - ඩබ්ලිව්.එම්.කේ.විජේතුංග, කොළඹ, ගුණසේන සහ සමාගම, පිටු. 63-112.

රයන්, බ්‍රයිස්. (2015) **සිංහල සමාජයේ කුල ක්‍රමය**, (පරි.) චන්ද්‍ර ශ්‍රී රණසිංහ, කොළඹ, සීමාසහිත ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රාහුල, වල්පොල. (2009) **ලක්දිව බුදු සමයෙහි ඉතිහාසය**, කොළඹ, ඇස්. ගොඩගේ සහෝදරයෝ.

රොබට්ස්, මයිකල්. සංස්කරණය-(1977) **ලංකා ජාතික සංගමයේ ලිපි ලේඛණ සහ ලංකාවේ ජාතිමාමක දේශපාලන ව්‍යාපාරය 1929-1950**, I කාණ්ඩය, (පරි.)- රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, කොළඹ, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව.

ලියනගමගේ, අමරදාස සහ ගුණවර්ධන, රණවීර. (2014) **අනුරාධපුර යුගය**, කොළඹ, ගොඩගේ සහ සහෝදරයෝ.

වික්‍රමසිංහ. නීරා, (2012) 'සමාජ පරිවර්තනය : විපර්යකාරකයන් හා විපර්යාසකාරක රටාවන්', **ශ්‍රී ලාංකේය ඉතිහාසය**, වෙළුම IV, සංස්කරණය-ඩබ්.එම්.කේ. විජේතුංග, කොළඹ, එම්.ඩී. ගුණසේන සහ සමාගම, පිටු. 183-212.

සිරිවීර, ඉන්ද්‍රකීර්ති, (2012) සමාජීය විකාශය, **ශ්‍රී ලාංකේය ඉතිහාසය**, වෙළුම් I, සංස්කරණය-ඩබ්.එම්.කේ.විජේතුංග, කොළඹ, එම්.ඩී. ගුණසේන සහ සමාගම, පිටු. 257-278.

සිල්වා, කේ.ටී. (2005) **කුලය පංතිය සහ ලංකාවේ සමාජ ගැටුම්**, බොරලැස්ගමුව, විසිදුණු ප්‍රකාශකයෝ.

සෝමතිලක, මහින්ද. (2018) **ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලන සමයෙහි වතු වගාව සහ එහි ප්‍රතිඵල**, කොළඹ, ගොඩගේ සහ සහෝදරයෝ.

Allichin, Raymond. & Briget Allchin. (1968) *The Birth of an Indian Civilization. Chicago*, University Chicago Press.

Andradi, W.M.D.D. (1967) *English Educated Ceylonese in the Official life of Ceylon from 1865 to 1883*, unpublishied PhD thesis, University of London.

Arasaratham, S. (1964) Ceylon, New Jersey, Prentice-Hall, Inc. Englewood Clifts.

From: Barns to Colebrooke letters 1830, *Colonial office Nos.54, 112*. (S.L.N.A.)

Casinader, A. (1974) *"The evaluvation of the Graphite Industry in Sri Lanka, 1829-1973: Patterns of Trade and enterpreneurship"* Ceylon Studies Seminar, 1974 Series, No. 7. Serial No. 51. 1-22 pp.

De Silva, K.M. (2008) *A History of Sri Lanka*. Colombo : Vijitha Yapa Publishers.

Furnival, J.H. (1947) *Netherland's India, Their Plural Society*, Cambridge, University of Cambridge.

Ghurye. G.S. (1950) *Caste and Race in India*, Bombay, Popular Prakashan.

Hocart, A.M. (1950) *Kings and Councilors*, Chicago, University Chicago Press.

Hulugalla, H.A.J. (1969) *"The National Movement and its influence of Education", Education in Ceylon* : A Century Volume, Ministry of Education, 484-490 pp.

Hutton, J.H. (1946) *Caste in India*, London, Cambridge University Press.

Jayawardena, Kumari. (1971) *"The Orgins of the Left Movement in Sri Lanka"*, Moden Ceylon Studies, Vol. 2, No. 2, Colombo, Apothecaries Co. Ltd, 195-221 pp.

___ (2007) *No Bodies to Somebodies, The Rise of the Colonial Bourgeoisie in Sri Lanka,* Colombo, Social Scientist's Association and Sanjiva Books.

___ (2010) *Perpetual Ferment. Polular Revolts in Sri Lanka in the 18- and 19th centuries*, Colombo, social scientist's Association.

Jayaweera, Swarna. (1973) "*Education Policy in the Early Twentieth Century*", University of Ceylon History of Ceylon, Vol. II & IV, University of Peradeniya 461-475 pp.

Jupp, James. (1978) *Sri Lanka Third World Democracy*, Colombo, K.V.G. De Silva & Sons Ltd, 27-55pp.

Fernando, Tissa, and Kearney R.N.(ed.), (1979), *Modern Sri Lanka : A Society in Transition,* New york, Syracuse University Press.

Kearney, R.N. (1967) *Communilism and Language in the politics of Ceylon*, Durham, Duke University press.

Linton, Ralph. (1936) *The Study of Man*, New York, Appleton - Century-Crofts, Inc.

Madan, Vandana. (2005) *Village in India, India*, Oxford Universiyt press.

Leach, E.R. (1960) *Aspect of Caste in South India, Ceylon and Northwest Pakistan*. Cambridge, Cambridge University Press.

Obeysekare, Gananth. (1967) *Land Tenure in Village Ceylon*, London, Cambridge University Press.

Peebles, Patrick. (1995) *Social change in Nineteenth Century Ceylon*, New Delhi, Navrang Booksellers and Publishers.

Pieris, Ralph. (1951) *"Society and Ideology in Ceylon during a Time of Troubles, 1795-1850,* University of Ceylon Review (U.C.R.), Vol. 9, No. 4, University of Peradeniya, 266-279 pp.

Roberts, Michael. (1973) *"Elite Formation and Elites. 1932-1931"*, University of History of Ceylon (U.C.H.C.), Vol. III, Chapter 01: 263-284pp.

____ (ed.) (1982) *Caste Conflict and Elite formation : The Rise of a karawa Elite in Sri Lanka 1500-1931*, London, Cambridge University Press.

____ (ed). (1997) *Sri Lanka Collective identities Revisited*, Vol. I, Colombo. Marga Institute

Roberts, Norah. (2013) *Galle as Quiet Asleep*, Colombo, Vijitha Yapa Publications.

Ruberu, Ranjith. (1963) *"Education work of the christian Missionary Societies in Ceylon dunly the early years of British Rule,* The Ceylon Journial Historical & Social Studies, vol. 6, No. 1, 71-83 pp.

From Brownrigg to Bathurst 17. July 1818, 5/5, Nos. 290-291. (S.L.N.A).

Tampoe, Manel. (1997) *The story of Selestina Dias*, Colombo, Social Science.

Wickramaratne, L.A. (1973) *"Education and Social Change 1832 to 1900"*, University of Ceylon History of Ceylon, Vol. II, University of Peradeniya; 165-186 pp.

Wright, Arnold. (ed.) (1907) *Twentieth Century Impressions of Ceylon: Its History, People, Commerce, Industries and Resources*, London, Lioyds, Grater Britain Publishing Co.

Yogasundram, (2006) *A comprehensive History of Sri Lanka from prehistoric Times to the preseat*, Colombo, Vijitha Yapa Publications, 285-299 pp.